# මුදල් හා බැංකු කටයුතු

## මුදල් සැපයුම


### සමස්ත උපනතින්

දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අඛණ්ඩව පැවතුනද 1991 වර්ෂය තුලදී මූල්‍ය ප්‍රසාරණ වේගය තවදුරටත් තිව්‍ර විය. මෙයට ප්‍රධාන වශයෙන්ම, බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම්හි සැළකිය යුතු ඉහළයාම හා අඛණ්ඩව සිදුවූ තියුණු දේශීය ණය ප්‍රසාරණය හේතු විය. මහජනතාව සතු ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත වන පටු මුදල් සැපයුමේ ($M_1$) 1990 දී සිදුවූ සියයට 13 ක් වූ වාර්ෂික වර්ධනය හා සසඳා බලන විට 1991 අවසානයේදී වාර්ෂික වර්ධනය සියයට 18 දක්වා ඉහළ නැගුණි. මීට සමානව $M_1$ හා වාණිජ බැංකු වෙතැති මහජනතාව සතු කාලීන හා ඉතුරුම් තැන්පතු වලින් සැදුම්ලත් පුළුල් මුදල් සැපයුමේ ($M_2$) වාර්ෂික වර්ධන වේගය මෙම කාලපරිච්ඡේදය තුලදී සියයට 19 සිට සියයට 23 දක්වා ඉහළ ගියේය. 1991 ප්‍රථම සිව් මස තුලදී මූල්‍ය සමස්තයන්ගේ ප්‍රසාරණය සුළු වශයෙන් පහත වැටුනද, ඉන්පසු ආන්තික උච්චාවචනයන් සහිතව වර්ධනය වේගවත් විය. $M_1$ හි වාර්ෂික වර්ධනය 1990 අවසානයේදී සියයට 13 සිට 1991 අප්‍රේල් මාසයේදී සියයට 9 දක්වා පහත වැටුනද, ඉන්පසු එය වර්ෂය අවසානයේදී සියයට 18 දක්වා වේගවත්ව වර්ධනය විය. ඊට සමාන ප්‍රවනතාවයක් පෙන්නුම් කරමින්, පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය 1990 අවසානයේදී සියයට 19 සිට 1991 අප්‍රේල් මාසයේදී සියයට 15 දක්වා පහත වැටුණ අතර, ඉන්පසු එය ඊට ප්‍රතිවිරුද්ධව 1991 නොවැම්බර් මාසයේදී සියයට 25 දක්වා ඉහළ ගොස් නැවත දෙසැම්බර් මසදී සියයට 23 දක්වා පහත වැටිණි. වර්ෂය පුරාම අඛණ්ඩව සිදුවූ දැඩි මූල්‍ය හා ණය ප්‍රසාරණය හේතුකොටගෙන මූල්‍ය හා ණය සමස්තයන්ගේ වර්ධනය වැලැක්වීම පිණිස 1990 අවසානයේ පැවති සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්ති තවදුරටත් දැඩි කිරීමට මහ බැංකුවට සිදුවිය.

මූල්‍ය පදනම (සංචිත මුදල් හෝ අධිබලැති මුදල්) පසුගිය වර්ෂයේ සිදුවූ රුපියල් දශ ලක්ෂ 4,789 ක් හෙවත් සියයට 17.9 ක ඉහළ යාම හා සසඳා බලන විට 1991 දී රුපියල් දශ ලක්ෂ 8,476 හෙවත් සියයට 26.8 ක සැළකිය යුතු ඉහළයාමක් වාර්තා කළේය. මූලාශ්‍ර අංශයෙහිලා සළකන කල මූල්‍ය පදනමෙහි ප්‍රසාරණයට විශාල වශයෙන් දායක වූයේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ශුද්ධ විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 8,811 කින් ඉහළ යාමයි. ඊට ප්‍රතිවිරුද්ධව, මහ බැංකුවෙහි ශුද්ධ දේශීය වත්කම් වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 334 කින් පහළ ගියේය. රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 2,351 කින් ඉහළ යාමක් පැවතුනද, බැංකුවෙන් දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණය රුපියල් දශ ලක්ෂ 1,986 කින් සැළකිය යුතු ලෙස පහළයාම නිසා හා ශුද්ධ අනෙකුත් වත්කම් රුපියල් දශ ලක්ෂ 699 කින් ඉහළයාම නිසා මහ බැංකුවෙහි ශුද්ධ දේශීය වත්කම් 1991 වර්ෂය තුලදී පහත වැටුණි. උපයෝජන අංශයෙහිලා සළකන කල, මහ බැංකුවෙහි මුදල් නිකුතුව (රුපියල් දශ ලක්ෂ 3,622)හා තැන්පතු (රුපියල් දශ ලක්ෂ 4,854) යන දෙකෙහිම ප්‍රසාරණයක් පෙන්නුම් කළේය.

### මුදල් සැපයුම හා එයට බලපෑ සාධක

පටු මුදල් සැපයුම ($M_1$) 1990 දී රුපියල් දශ ලක්ෂ 4,540 ක හෙවත් සියයට 13 ක වැඩිවීම හා සසඳා බලන විට 1991 දී රුපියල් දශ ලක්ෂ 7,176 කින් හෙවත් සියයට 18 කින් ඉහළ ගියේය. වර්ෂය තුලදී $M_1$ හි වැඩිවීම විශාල වශයෙන් පිළිබිඹු වූයේ ඉල්ලුම් තැන්පතුවල රුපියල් දශ ලක්ෂ 4,444 කින් හෙවත් සියයට 25 කින් වැඩිවීම මගින් වන අතර ඒ හා සැසඳෙන පසුගිය වසරෙහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 2,070 ක් හෙවත් සියයට 13 ක් විය. මේ අතර, $M_1$ හි අඩංගු වන ව්‍යවහාර මුදල් ප්‍රමාණය 1990 දී රුපියල් දශ ලක්ෂ 2,470 ක් හෙවත් සියයට 13 ක වැඩිවීම හා සසඳා බලන විට 1991 දී රුපියල් දශ ලක්ෂ 2,732 කින් හෙවත් සියයට 12 කින් ඉහළ ගියේය. මේ අනුව $M_1$ හි අඩංගු වන ව්‍යවහාර මුදල් කොටස 1990 දී සියයට 55 සිට 1991දී සියයට


මුදල් සැපයුම
මාසිකව
රුපියල් දශ ලක්ෂ
රුපියල් දශ ලක්ෂ
120000
100000
80000
60000
40000
20000
0
120000
100000
80000
60000
40000
20000
0
පුළුල් මුදල් සැපයුම
කාලීන සහ
ඉතිරි කිරීමේ
තැන්පතු
පටු මුදල් සැපයුම
ඉල්ලුම් තැන්පතු
ව්‍යවහාර මුදල්
1987
1988
1989
1990
1991

ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.56 සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් 1989 - 1991

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයට | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1991 | වෙනස% 1989/1988 | වෙනස% 1990/1989 | වෙනස% 1991/1990 | 1989 | 1990 | 1991 | වෙනස% 1989/1988 | වෙනස% 1990/1989 | වෙනස% 1991/1990 |
| ජනවාරි | 31,237 | 35,442 | 39,913 | +23.3 | +13.5 | +12.6 | 67,980 | 76,879 | 90,161 | +13.2 | +13.1 | +17.3 |
| පෙබරවාරි | 31,754 | 36,750 | 40,416 | +23.7 | +15.7 | +10.0 | 68,143 | 78,590 | 90,867 | +12.0 | +15.3 | +15.6 |
| මාර්තු | 32,615 | 37,402 | 41,876 | +22.4 | +14.7 | +12.0 | 69,841 | 81,169 | 93,814 | +14.3 | +16.2 | +15.6 |
| අප්‍රේල් | 32,718 | 38,122 | 41,411 | +19.1 | +16.5 | +8.6 | 70,503 | 81,876 | 94,292 | +12.9 | +16.1 | +15.2 |
| මැයි | 31,862 | 36,767 | 41,190 | +13.1 | +15.4 | +12.0 | 69,750 | 80,771 | 95,317 | +9.5 | +15.8 | +18.0 |
| ජූනි | 32,037 | 36,386 | 41,602 | +15.3 | +13.6 | +14.3 | 69,717 | 81,407 | 96,162 | +10.5 | +16.8 | +18.1 |
| ජූලි | 33,447 | 36,206 | 40,801 | +19.2 | +8.2 | +12.7 | 70,867 | 81,469 | 96,456 | +11.3 | +15.0 | +18.4 |
| අගෝස්තු | 34,016 | 36,496 | 41,821 | +20.5 | +7.3 | +14.6 | 71,345 | 82,956 | 98,941 | +11.3 | +16.3 | +19.3 |
| සැප්තැම්බර් | 34,527 | 37,429 | 43,274 | +21.3 | +8.4 | +15.6 | 72,964 | 85,057 | 101,896 | +14.1 | +16.6 | +19.8 |
| ඔක්තෝබර් | 34,533 | 36,811 | 43,187 | +20.4 | +6.6 | +17.3 | 73,375 | 85,973 | 105,366 | +14.0 | +17.2 | +22.6 |
| නොවැම්බර් | 34,103 | 37,490 | 43,157 | +12.3 | +9.9 | +15.1 | 73,942 | 86,659 | 107,976 | +11.9 | +17.2 | +24.6 |
| දෙසැම්බර් | 35,338 | 39,878 | 47,055 | +9.1 | +12.8 | +18.0 | 76,434 | 91,017 | 112,097 | +12.5 | +19.1 | +23.2 |
| මාසික සාමාන්‍යය | 33,182 | 37,098 | 42,142 | +18.1 | +11.8 | +13.6 | 71,238 | 82,819 | 98,612 | +12.3 | +16.2 | +19.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.57 වැනි සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් සහ ඒවාට තුඩුදුන් සාධක 1989 - 1991

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ


| ශීර්ෂය | 1989 දෙසැම්බර් | 1990 දෙසැම්බර් | 1991 දෙසැම්බර් | 1989/1990 වෙනස | | 1990/1991 වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය |
| **මූල්‍ය සමස්තයන්** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 19,650 | 22,120 | 24,852 | +2,470 | +12.6 | +2732 | +12.4 |
| 2. මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු | 15,688 | 17,758 | 22,202 | +2,070 | +13.2 | +4444 | +25.0 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 35,338 | 39,878 | 47,055 | +4,540 | +12.8 | +7177 | +18.0 |
| 3. වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු | 41,095 | 51,139 | 65,043 | +10,044 | +24.4 | +13904 | +27.2 |
| 3.1 සමූපකාර ආයතන | 895 | 927 | 1,743 | +32 | +3.6 | +816 | +87.9 |
| 3.2 රාජ්‍ය සංස්ථා | 4,230 | 4,664 | 7,509 | +434 | +10.3 | +2845 | +61.0 |
| 3.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන් (අ) | 35,970 | 45,548 | 55,791 | +9,578 | +26.6 | +10243 | +22.5 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 76,433 | 91,017 | 112,097 | +14,584 | +19.1 | +21080 | +23.2 |
| **තුඩුදුන් සාධක** | | | | | | | |
| 1. දේශීය ණය | 102,321 | 119,864 | 134,226 | +17,543 | +17.1 | +14,362 | +12.0 |
| 1.1 රජයට දෙන ලද ශුද්ධ ණය | 36,119 | 39,197 | 41,792 | +3,078 | +8.5 | +2,595 | +6.6 |
| 1.1.1 රජයට දෙන ලද දළ ණය | 44,740 | 52,524 | 59,458 | +7,784 | +17.4 | +6,934 | +13.2 |
| මහ බැංකුව විසින් | 36,741 | 38,206 | 45,981 | +1,465 | +4.0 | +7,775 | +20.3 |
| වාණිජ බැංකු විසින් | 7,999 | 14,318 | 13,477 | +6,319 | +79.0 | -841 | -5.9 |
| 1.1.2 රජයේ තැන්පතු සහ මුදල් ශේෂ | -8,621 | -13,327 | -17,666 | -4,706 | +54.6 | -4,339 | +32.5 |
| 1.2 පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය | 66,202 | 80,667 | 92,434 | +14,465 | +21.8 | +11,767 | +14.6 |
| 1.2.1 සමූපකාර ආයතන | 1,178 | 1,596 | 1,757 | +418 | +35.5 | +161 | +10.0 |
| 1.2.2 රාජ්‍ය සංස්ථා | 13,862 | 15,636 | 14,077 | +1,774 | +12.8 | -1,559 | -10.0 |
| 1.2.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් | 51,162 | 63,435 | 76,599 | +12,273 | +24.0 | +13,164 | +20.7 |
| 2. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) | 4,732 | 10,206 | 17,305 | +5,474 | +115.7 | +7,099 | +69.5 |
| 2.1 මහ බැංකුවෙන් | 1,678 | 4,675 | 13,486 | +2,997 | +178.6 | +8,811 | +188.5 |
| 2.2 වාණිජ බැංකුවලින් | 3,054 | 5,531 | 3,819 | +2,477 | +81.1 | -1,712 | -31.0 |
| 3. අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) | -30,620 | -39,053 | -39,434 | -8,433 | +27.5 | -381 | -1.0 |
| 3.1 මහ බැංකුවේ අනෙකුත් වගකීම් (ශුද්ධ) | -13,176 | -15,039 | -15,739 | -1,863 | - | -700 | -4.6 |
| 3.2 වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) | -19,043 | -24,968 | -23,651 | -5,925 | - | +1,317 | +5.3 |
| 3.3 හුවමාරුවෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි | 1,599 | 954 | -44 | -645 | - | -998 | -104.6 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 76,433 | 91,017 | 112,097 | +14,584 | +19.1 | +21,080 | +23.2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සලකුණුවලින් (+ හා -) පුළුල් මුදල් සැපයුම ($M_2$) හි බලපෑම් දැක්වේ.

(අ) නිර්නේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

## දේශීය ණය
මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

53 දක්වා පහත වැටුණි. මේ අතර,ආසන්න මුදල් 1990දී රුපියල් දශ ලක්ෂ 10,044 හෙවත් සියයට 24 ක වැඩිවීම හා සසඳා බලන විට, 1991 දී රුපියල් දශ ලක්ෂ 13,904 කින් හෙවත් සියයට 27 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසරෙහි රුපියල් දශ ලක්ෂ 14,584කින් හෙවත් සියයට 19 කින් ඉහළ ගිය පුළුල් මුදල් සැපයුම ($M_2$) 1991 දී රුපියල් දශ ලක්ෂ 21,080 කින් හෙවත් සියයට 23 ක පුළුල්වීමක් වාර්තා කළේය. $M_2$ හි සංයුතියෙහි ආසන්න මුදල්වල සාපේක්ෂ කොටස එම කාලය තුලදී සියයට 56 සිට සියයට 58 දක්වා ඉහළ ගිය අතර, එමගින් පොළී සහිත ද්‍රවශීල වත්කම් දැරීමට මහජනතාව තුළ ඇති දැඩි ලැදියාව පිළිබිඹු කෙරිණ.

පසුගිය වසරෙහි මෙන්ම, 1991 වසරෙහිදී ද කාලීන හා ඉතුරුම් තැන්පතුවල වැඩිවීම බොහෝ දුරටම පිළිබිඹු වූයේ අනෙකුත් පෞද්ගලික අංශයෙහි (රාජ්‍ය සංස්ථා සහ සමූපකාර හැර) වන අතර, එය රුපියල් දශ ලක්ෂ 10,243 කින් හෙවත් සියයට 22 කින් ඉහළ ගියේය. මේ අතර, වර්ෂය තුළදී රාජ්‍ය සංස්ථා හා සමූපකාර ආයතන සතු කාලීන හා ඉතුරුම් තැන්පතු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2,845 කින් හෙවත් සියයට 61 කින් හා රුපියල් දශ ලක්ෂ 815 කින් හෙවත් සියයට 88 කින් ඉහළ ගියේය. වාණිජ බැංකු විසින් තැන්පතු සඳහා පිරිනමන ලද තරගකාරී පොළී අනුපාතයන්හි වාසිදායක බලපෑම සහ ශුද්ධ විදේශ වත්කම් ඉහළ යාම නිසා වූ ද්‍රවශීලතා තත්ත්වයෙහි ප්‍රසාරණයත් වාණිජ බැංකු සතු කාලීන හා ඉතුරුම් තැන්පතු ඉහළ යාමට විශාල වශයෙන් බලපාන ලදී.

විමසුමට ලක්වූ වසර තුලදී, බැංකු ක්‍රමය සතු දේශීය ණය හා ශුද්ධ විදේශ වත්කම් යන දෙකම මුල්‍ය සමස්තයන් කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළේය. පසුගිය වසරට වඩා අඩු වර්ධන අනුපාතයක් පෙන්නුම් කළද, වර්ෂය තුලදී දේශීය ණය ශුද්ධ විදේශ වත්කම් වලට වඩා මූල්‍ය සමස්තයන් කෙරෙහි වැඩි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළේය. දේශීය ණයෙහි වර්ධනය ප්‍රධාන වශයෙන්ම පිළිබිඹු වූයේ පෞද්ගලික අංශයේ ණය උපයෝජනය තුලිනි. මේ හා සසඳන කල, රජයට දෙන ලද ශුද්ධ ණය වර්ෂය තුලදී වර්ධනය වූයේ මද වශයෙනි. අනෙක් අතට, රාජ්‍ය සංස්ථාවල ණය උපයෝජනය වර්ෂය තුලදී මද වශයෙන් පහත වැටුනි.

1991 අවසානයේදී තැන්පතු රුපියල් දශ ලක්ෂ 4,339 කින් වර්ධනය වුවද, රජයට දෙන ලද දළ ණය රුපියල් දශ ලක්ෂ 7,775 කින් වර්ධනය වීම හේතු කොටගෙන, මහ බැංකුවෙන් රජයට දෙන ලද ශුද්ධ ණය 1991 වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 2,351 කින් ඉහල ගියේය. රජයට දෙන ලද මහ බැංකු ණය ඉහළයාම, ණය හා අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 4,955 කින් හා ඉහළ මට්ටමක පැවති රුපියල් දශ ලක්ෂ 2,820 ක්වූ රාජ්‍ය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් දැරීමකින් සමන්විත විය. කෙසේ වෙතත්, මහ බැංකුවෙන් රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් හි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඇති වගකීම් ප්‍රතිඇගයීම ගැළපීම සඳහා දෙන ලද රුපියල් දශ ලක්ෂ 2,949 ක විශේෂ ණය මුදලද අන්තර්ගත විය. මේ අතර, වාණිජ බැංකු ක්‍රමය මගින් රජයට, දෙන ලද දළ ණය රුපියල් දශ ලක්ෂ 841 ක පහළ වැටීම හා රාජ්‍ය තැන්පතු රුපියල් දශ ලක්ෂ 1,084 කින් පහළ වැටීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස වාණිජ බැංකු ක්‍රමය මගින් රජයට දෙන ලද ශුද්ධ ණය 1991 දී රුපියල් දශ ලක්ෂ 243 කින් හෙවත් සියයට 5 කින් ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 1991 දී මූල්‍ය සමස්තයන් කෙරේ ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරමින් බැංකු ක්‍රමය මගින් රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 2,595 කින් හෙවත් සියයට 7 කින් ඉහළ ගියේය.

වාණිජ බැංකු මගින් අඛණ්ඩව ඉහළ පොළී අනුපාතයක් අයකරනු ලැබුවද, පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය ප්‍රමාණය 1990 දී රුපියල් දශ ලක්ෂ 14,465 ක් හෙවත් සියයට 22 ක වැඩිවීම හා සසඳා බලන කල, 1991 දී රුපියල් දශ ලක්ෂ 11,767 කින් හෙවත් සියයට 15 කින් වර්ධනය විය. සමස්ථ පෞද්ගලික අංශය තුළ අන්තර්ගත අනෙකුත් පෞද්ගලික අංශයෙහි ගණුදෙනු කරුවන්ගේ ණය භාවිතය ප්‍රසාරණය වන ආර්ථික ක්‍රියාකාර කම් සඳහා ඉහළ ණය ඉල්ලුමක් පිළිබිඹු කරමින්, වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 13,164 කින් හෙවත් සියයට 21 කින් ප්‍රසාරණය විය. සංසන්දනාත්මකව බලන කල, සමූපකාර අංශයට දෙන ලද බැංකු ණය රුපියල්

දශ ලක්ෂ 161 කින් ඉහළ ගිය අතර, රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය සැලකිය යුතු ලෙස පහත වැටුනේය.

1991 මුල් එකොළොස් මස තුළදී රාජ්‍ය සංස්ථාවන්හි ණය උපයෝජනය ඉහළ යාමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරනු ලැබුවද, දෙසැම්බර් මාසය තුලදී තියුණු ලෙස පහත වැටුණේය. රාජ්‍ය සංස්ථාවලට දෙන ලද සමස්ත ණය ප්‍රමාණය වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 1,559 කින් හෙවත් සියයට 10 කින් පහත වැටුණි. කෙසේ වෙතත්, රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය ප්‍රමාණයෙහි පහත වැටීම ප්‍රධාන වශයෙන්ම මැදිකාලීන ආයෝජන වැඩපිළිවෙල (MTIP) හා තේ පුනරුත්ථාපන හා විවිධාංගීකරණ ව්‍යාපෘතිය (TRAD) යටතේ රජයේ කොටස් සහභාගිත්වය ලෙස වාණිජ බැංකු මගින් වැවිලි සංස්ථාවන් දෙකට දෙන ලද ණය ආපසු පැවරුමෙහි ප්‍රතිඵලයකි. මෙලෙස, 1991 දෙසැම්බර් මසදී පවරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 3,238 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 1,482 ක් ජනතා වතු සංවර්ධන මණ්ඩලයටද (ජනවසම), රුපියල් දශ ලක්ෂ 1,756 ක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට (ශ්‍රී.ලං. රා. වැ.සං.) ද අයත්විය. ඒ අනුව අවාසිදායක තේ මිළ ගණන් වල බලපෑම යටතේ මෙම සංස්ථා දෙකම වර්ෂය තුලදී බැංකු ණය අධික ලෙස භාවිතා කළද වර්ෂය අවසානයේ ජන වසම මගින් ණය උපයෝජනය රුපියල් දශ ලක්ෂ 135 කින් හෙවත් සියයට 6 කින් අඩු වුණු අතර, එය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි රුපියල් දශ ලක්ෂ 1,425 කින් හෙවත් සියයට 53 කින් පහත වැටිණි. මේ අතර, සමූපකාර තොග වෙළඳ සංස්ථාවට දෙන ලද බැංකු ණය (ස.තො. ස) 1990 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 3,856 සිට 1991 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 2,836 දක්වා පහත වැටුණේය. මෙය කලහැකි වූයේ සමහර ආයෝජනයන් ඉවත් කර ගැනීමෙන් (කොටස් විකිණීම) හා පරිපාලන වියදම් පිරිමැසුම්දායක කර ගැනීමෙනි. කෙසේ වෙතත්, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි ණය අවශ්‍යතා, අඛණ්ඩව පැවති පාඩු සහගත තත්ත්වය, ආනයනය කරන අමු ද්‍රව්‍ය කීපයක මිළ ඉහළ යාම හා ඉහළ පොළී පිරිවැය හේතුකොටගෙන රුපියල් දශ ලක්ෂ 2,663 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 1990 දී රුපියල් දශ ලක්ෂ 419 කින් ප්‍රසාරණය වූ සමූපකාර අංශයට දෙන ලද බැංකු ණය 1991 දී රුපියල් දශ ලක්ෂ 161 ක සුළු වැඩිවීමක් වාර්තා කළේය.

බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශ ලක්ෂ 7,099 කින් හෙවත් සියයට 70 කින් සැලකිය යුතු ලෙස ඉහළ යාමක් වාර්තා කරමින්, 1991 වර්ෂය තුලදී අඛණ්ඩව ශක්තිමත් තත්ත්වයක් පෙන්නුම් කළේය. ශුද්ධ විදේශ වත්කම්හී වැඩිවීම මහ බැංකුව සතු ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශ ලක්ෂ 8,811 කින් වැඩිවීමෙහි හා වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශ ලක්ෂ 1,713 කින් පහල යාමේත් ඒකාබද්ධ ප්‍රතිඵලයකි. මහ බැංකුව සතු ශුද්ධ විදේශ වත්කම්හි ඉහළයාම මුළුමණින්ම භාණ්ඩාගාර බිල්පත්ද ඇතුළුව විදේශ මුදල් ශේෂ රුපියල් දශ ලක්ෂ 12,765 කින් ඉහළ යාමෙහි ප්‍රතිඵලයකි. මෙම වැඩිවීමෙන් කොටසක් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයෙහි තැන්පතු රුපියල් දශ ලක්ෂ 3,746 කින් ඉහළ යාම මගින් සමනය කරනු ලැබිණ. වාණිජ බැංකුවල ශුද්ධ විදේශ වත්කම් පහළ යාමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ අනේවාසික විදේශීය ව්‍යවහාර මුදල් (NRFC) හා විජාතික නේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් (RNNFC) තැන්පතු වගකීම් ඉහළ යාම වන අතර, එම තැන්පතු වගකීම් වල ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,220 ක් විය. සහනදායී ණය උපයෝජනය ඉහල මට්ටමක පැවතීම නිසා වාසිදායක ගෙවුම් ශේෂ තත්ත්වයක් පවත්වාගත හැකි වූ අතර එම හේතුවෙන් වසර තුලදී බැංකු ක්‍රමයට විදේශීය වත්කම් රැස්කිරීමටද හැකිවිය.


## වාණිජ බැංකු කටයුතු

### සමස්ත උපනතීන්

1991 වර්ෂය තුලදී වාණිජ බැංකු කටයුතු තවදුරටත් පුළුල් විය. තැන්පතු රාශිකරණය, ණය ප්‍රසාරණය, සේවා පහසුකම් හා ශාඛා ව්‍යාප්ති වැඩපිළිවෙල තුලින් මෙය පිළිබිඹු විය.

# බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1991 වර්ෂය තුළදී වාණිජ බැංකුවල ද්‍රවශීලතා තත්ත්වය සතුටුදායක තත්ත්වයක පැවතිණ. ඉල්ලුම් තැන්පතු හා ද්‍රවශීල වත්කම් අතර අනුපාතය 1990 දී සියයට 149 සිට 1991 දී සියයට 160 දක්වා අතරතුර සුළු උච්චාවචනයක් සහිතව ඉහළ ගියේය. වර්ෂය තුළදී ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 3,426 ක වැඩිවීමට එරෙහිව ද්‍රවශීල වත්කම් රුපියල් දශ ලක්ෂ 8,563 කින් ප්‍රසාරණය විය. ද්‍රවශීල වත්කම්වල මෙම ප්‍රසාරණය මහ බැංකුවෙන් ලැබිය යුතු මුදල් ශේෂ, විදේශ මුදල් ශේෂ හා වට්ටම් කළ බිල්පත් වැඩිවීම තුළින් පිළිබිඹු විය.

### 1.58 සංඛ්‍යා සටහන

### වාණිජ බැංකු වත්කම් හා වගකීම් හි තෝරාගත් ශීර්ෂ 1990 - 1991

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | මාසික සංඛ්‍යාවන්ගේ සාමාන්‍යය | | කාලච්ඡේදය අවසානයේදී | |
|---|---|---|---|---|
| | 1990 | 1991 | 1990 | 1991 |
| අතැති මුදල් සහ මහ බැංකුව වෙතැති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත ඇතුළත්ව) | 7,649 | 12,263 | 9,406 | 15,421 |
| විදේශීය ශේෂ | 9,201 | 15,299 | 12,077 | 13,833 |
| භාණ්ඩාගාර බිල්පත් | 8,893 | 8,569 | 11,237 | 9,899 |
| වට්ටම් කළ බිල්පත් | 6,579 | 8,175 | 7,368 | 9,499 |
| මුළු ද්‍රවශීල වත්කම් | 32,289 | 40,780 | 40,089 | 48,652 |
| මුළු ආයෝජන (අ) | 2,012 | 1,892 | 2,040 | 2,081 |
| මුළු ණය මුදල් සහ අයිරාවන් | 67,165 | 80,617 | 74,274 | 84,752 |
| ඉල්ලුම් තැන්පතු (ආ) | 22,529 | 25,787 | 26,880 | 30,310 |
| කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු (ඇ) | 56,295 | 70,670 | 63,664 | 81,281 |
| මුළු තැන්පතු | 78,823 | 96,457 | 90,544 | 111,591 |
| අනුපාතය | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතුවලට මුදල් | 34.0 | 47.6 | 35.0 | 50.9 |
| මුළු තැන්පතුවලට මුදල් | 9.7 | 12.7 | 10.4 | 13.8 |
| මුළු තැන්පතුවලට විදේශීය ශේෂ | 11.7 | 15.9 | 13.3 | 12.4 |
| මුළු තැන්පතු වලට භාණ්ඩාගාර බිල්පත් | 11.3 | 8.9 | 12.4 | 8.9 |
| මුළු තැන්පතු වලට වට්ටම් කළ වාණිජ බිල්පත් | 8.3 | 8.5 | 8.1 | 8.5 |
| ඉල්ලුම් තැන්පතු වලට ද්‍රවශීල වත්කම් | 143.3 | 158.1 | 149.1 | 160.5 |
| මුළු තැන්පතුවලට ද්‍රවශීල වත්කම් | 41.0 | 42.3 | 44.3 | 43.6 |
| මුළු තැන්පතුවලට ආයෝජන | 2.6 | 2.0 | 2.3 | 1.9 |
| මුළු තැන්පතු වලට ණය මුදල් සහ අයිරාවන් | 85.2 | 83.6 | 82.0 | 75.9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් සහ පෞද්ගලික සුරැකුම්පත්.
(ආ) දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නොවේ.
(ඇ) 1990 සහ 1991 වර්ෂයන්හිදී රාජ්‍ය බැංකු දෙක මගින් විශේෂ ඉතිරි කිරීමේ ගිණුම් ක්‍රමය යටතේ දිගු කාලීන තැන්පතු වශයෙන් රැස්කරන ලද පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,964 ක් සහ රුපියල් දශලක්ෂ 2,321 ක ඉතිරිකිරීම් ඇතුළත් වේ.
සටහන: මෙහි දක්වා ඇති සංඛ්‍යාවල සහ මෙම වාර්තාවෙහි ම වෙනත් ස්ථානයක දක්වා ඇති සංඛ්‍යාවල වෙනස්කම් ඇත්තේ අර්ථ නිරූපනයෙහි ඇති වෙනස්කම් හේතුවෙනි.

## 1. 59 සංඛ්‍යා සටහන

### අරමුණු හා කල්පිරීම් රටාව අනුව වර්ග කරන ලද වාණිජ බැංකු අත්තිකාරම් * 1990 - 1991

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| වර්ගීකරණය | කෙටි කාලීන (අවු. 1ට අඩු) | | මැදි කාලීන (අවු. 1 සිට 5 දක්වා) | | දිගු කාලීන (අවු. 5ට වැඩි) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | (1) | (2) (1),(7) හි ප්‍රතිශතයක් වශයෙන් | (3) | (4) (3),(7) හි ප්‍රතිශතයක් වශයෙන් | (5) | (6) (5),(7) හි ප්‍රතිශතයක් වශයෙන් | (7) | (8) (7) එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| **අ. වාණිජ** | | | | | | | | |
| 1990 දෙසැම්බර් | 30,108.7 | 80.8 | 4,732.7 | 12.7 | 2,443.4 | 6.6 | 37,284.8 | 46.4 |
| 1991 මාර්තු | 30,059.9 | 78.7 | 5,587.1 | 14.6 | 2,535.4 | 6.6 | 38,182.4 | 45.3 |
| 1991 ජුනි | 31,417.4 | 78.5 | 6,103.3 | 15.3 | 2,493.3 | 6.2 | 40,014.0 | 46.5 |
| 1991 සැප්තැම්බර් | 30,444.5 | 75.8 | 6,510.8 | 16.2 | 3,210.5 | 8.0 | 40,165.8 | 45.8 |
| **ආ. මූල්‍ය** | | | | | | | | |
| 1990 දෙසැම්බර් | 1,298.6 | 58.5 | 589.3 | 26.5 | 332.2 | 15.0 | 2,220.1 | 2.8 |
| 1991 මාර්තු | 1,560.0 | 60.2 | 663.5 | 25.6 | 367.7 | 14.2 | 2,591.2 | 3.1 |
| 1991 ජුනි | 1,357.0 | 55.6 | 729.0 | 29.9 | 355.1 | 14.5 | 2,441.1 | 2.8 |
| 1991 සැප්තැම්බර් | 1,617.9 | 56.9 | 832.0 | 29.3 | 393.7 | 13.8 | 2,843.6 | 3.2 |
| **ඇ. කෘෂිකාර්මික** | | | | | | | | |
| 1990 දෙසැම්බර් | 4,979.4 | 51.7 | 1,465.3 | 15.2 | 3,194.5 | 33.1 | 9,639.2 | 12.0 |
| 1991 මාර්තු | 4,780.5 | 46.3 | 2,027.3 | 19.6 | 3,522.7 | 34.1 | 10,330.5 | 12.3 |
| 1991 ජුනි | 4,959.1 | 47.7 | 2,182.3 | 21.0 | 3,264.5 | 31.4 | 10,405.9 | 12.1 |
| 1991 සැප්තැම්බර් | 5,265.8 | 47.7 | 2,402.9 | 21.8 | 3,363.7 | 30.5 | 11,032.4 | 12.6 |
| **ඈ. කාර්මික ** ** | | | | | | | | |
| 1990 දෙසැම්බර් | 13,008.6 | 73.9 | 2,433.5 | 13.8 | 2,166.6 | 12.3 | 17,608.7 | 21.9 |
| 1991 මාර්තු | 13,645.4 | 74.5 | 2,543.5 | 13.9 | 2,137.7 | 11.7 | 18,326.6 | 21.7 |
| 1991 ජුනි | 12,738.3 | 74.6 | 2,260.8 | 13.2 | 2,086.3 | 12.2 | 17,085.4 | 19.9 |
| 1991 සැප්තැම්බර් | 12,452.0 | 72.8 | 2,381.5 | 13.9 | 2,280.5 | 13.3 | 17,114.0 | 19.5 |
| **ඉ. සංචාරක** | | | | | | | | |
| 1990 දෙසැම්බර් | 345.0 | 42.9 | 85.6 | 10.6 | 373.7 | 46.5 | 804.3 | 1.0 |
| 1991 මාර්තු | 353.4 | 42.3 | 99.0 | 11.8 | 383.6 | 45.9 | 836.0 | 1.0 |
| 1991 ජුනි | 344.3 | 38.2 | 118.3 | 13.1 | 439.4 | 48.7 | 902.0 | 1.0 |
| 1991 සැප්තැම්බර් | 400.0 | 43.3 | 115.1 | 12.5 | 408.8 | 44.2 | 923.9 | 1.1 |
| **ඊ. නිවාස** | | | | | | | | |
| 1990 දෙසැම්බර් | 1,506.7 | 18.2 | 1,923.5 | 23.2 | 4,865.8 | 58.7 | 8,296.0 | 10.3 |
| 1991 මාර්තු | 1,685.3 | 18.7 | 2,062.0 | 22.8 | 5,282.2 | 58.5 | 9,029.5 | 10.7 |
| 1991 ජුනි | 1,798.0 | 18.7 | 2,167.3 | 22.6 | 5,642.7 | 58.7 | 9,608.0 | 11.2 |
| 1991 සැප්තැම්බර් | 1,850.8 | 18.7 | 2,302.3 | 23.2 | 5,757.0 | 58.1 | 9,910.1 | 11.3 |
| **උ. පරිභෝජන** | | | | | | | | |
| 1990 දෙසැම්බර් | 1,331.3 | 61.8 | 644.1 | 29.9 | 179.7 | 8.3 | 2,155.1 | 2.7 |
| 1991 මාර්තු | 1,595.5 | 68.2 | 553.6 | 23.7 | 190.0 | 8.1 | 2,339.1 | 2.8 |
| 1991 ජුනි | 1,686.2 | 62.2 | 812.6 | 30.0 | 210.7 | 7.8 | 2,709.5 | 3.2 |
| 1991 සැප්තැම්බර් | 1,629.4 | 60.6 | 830.0 | 30.9 | 228.6 | 8.5 | 2,688.0 | 3.1 |
| **ඌ. අනෙකුත් ණය** | | | | | | | | |
| 1990 දෙසැම්බර් | 1,346.2 | 43.4 | 895.4 | 43.4 | 857.7 | 43.4 | 3,099.3 | 3.9 |
| 1991 මාර්තු | 1,409.3 | 40.4 | 1,056.6 | 40.4 | 1,021.9 | 40.4 | 3,487.8 | 4.1 |
| 1991 ජුනි | 1,535.9 | 41.1 | 1,185.9 | 41.1 | 1,019.5 | 41.1 | 3,741.3 | 4.4 |
| 1991 සැප්තැම්බර් | 1,728.3 | 44.8 | 1,130.7 | 29.3 | 1,002.0 | 26.0 | 3,861.0 | 4.4 |
| **එ. එකතුව** | | | | | | | | |
| 1990 දෙසැම්බර් | 53,924.5 | 66.7 | 12,769.4 | 15.8 | 14,413.6 | 17.5 | 81,107.5 | 100.0 |
| 1991 මාර්තු | 55,089.3 | 64.9 | 14,592.6 | 17.2 | 15,441.2 | 17.9 | 85,123.1 | 100.0 |
| 1991 ජුනි | 55,836.2 | 64.5 | 15,559.5 | 18.0 | 15,511.5 | 17.5 | 86,907.2 | 100.0 |
| 1991 සැප්තැම්බර් | 55,388.7 | 62.8 | 16,505.3 | 18.7 | 16,644.8 | 18.5 | 88,538.8 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* අත්තිකාරම් වලට සංසරණයෙහි පවත්නා මුදල් ශීර්ෂයන් හැර ණය, අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත්ය.

** ඉංජිනේරු සහ ගොඩනැගිලි ව්‍යාපාර, කැනීම් සහ ධීවර කර්මාන්තය සඳහා දෙන ලද අත්තිකාරම් ඇතුළත් වේ.

බැංකු ක්‍රමය සතු සමස්ථ ද්‍රවශීලතා තත්ත්වය සතුටුදායක තත්ත්වයක පැවතියද, විශේෂයෙන්ම වර්ෂයේ මුල් කාර්තු තුන තුලදී ඒක්ෂණ මුදල් වෙළඳ පොළෙහි ගණුදෙනු ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතිණි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ මූල්‍ය හිඟයක් පැවති බැංකුවලින් කෙටිකාලීන අරමුදල් සඳහා විටින් විට ඇතිවූ ඉහළ ඉල්ලුමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි පොළී අනුපාතයන් 1990 දෙසැම්බර් මසදී සියයට 14 – 19 පරාසයක සිට 1991 පෙබරවාරි මසදී සියයට 16 – 35 ක් හා මැයි මසදී සියයට 16 – 39 ක උපරිම පරාසයක් දක්වා ලඟාවෙමින් 1991 දෙසැම්බර් මසදී සියයට 13 – 27 පරාසයක් දක්වා ඉහළ ගියේය.

මේ අතර, දේශීය සහ මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යාපාරික ආයතන යන දෙකෙහිම ආර්ථික කටයුතු ඉහළයාම හේතු කොට ගෙන පෞද්ගලික අංශයට දෙන ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 1991 වර්ෂය තුලදී අනෙකුත් පෞද්ගලික අංශයට  ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 13,164 කින් හෙවත්  සියයට 20.8 කින් ඉහළ ගියේය. මෙම වැඩිවීමෙන් භාගයකට ආසන්න ප්‍රමාණයක් වැඩිවූයේ වර්ෂයේ අවසාන කාර්තුව තුලදීය.

## බැංකු වත්කම් හා වගකීම් ව්‍යුහය හා පෞද්ගලික අංශයට දෙන ලද අත්තිකාරම්

වාණිජ බැංකුවල වත්කම් හා වගකීම් (ප්‍රති අයිතමයන් හි ශුද්ධ අගය ) පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 26,012 ක හෙවත් සියයට 25 ක වැඩිවීම හා සසඳා බලන විට 1991 දී රුපියල් දශ ලක්ෂ 22,997 කින් හෙවත් සියයට 17 කින් ඉහළ ගියේය. වගකීම් අංශයෙහි රුපියල් දශ ලක්ෂ 20,685 ක වැඩිවීමෙන් විශාල කොටසක් තැන්පතු වලින් සමන්විත විය. මෙය කාලීන හා ඉතුරුම් තැන්පතු (රුපියල් දශ ලක්ෂ 17,260 හෙවත් සියයට 28 ) හා ඉල්ලුම් තැන්පතු (රුපියල් දශ ලක්ෂ 3,425 හෙවත් සියයට 13) යන දෙකින් සමන්විත විය. වර්ෂය තුළදී විදේශීය ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 68 කින් හෙවත් සියයට 5 කින් ආන්තික වශයෙන් ඉහල ගිය අතර, වාණිජ බැංකු සතු අනෙකුත් වගකීම් රුපියල් දශ ලක්ෂ 1,238 කින් හෙවත් සියයට 5 කින් ඉහල යාමක් වාර්තා කළේය.

වත්කම් අංශයේ වැඩිවීමෙහි විශාලතම දායකත්වයක් (සියයට 55) වාර්තා කරමින් ණය සහ  අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 12,609 (සියයට 15) කින් ඉහල ගියේය. මෙම මුළු වැඩිවීමෙන් අයිරාවත් රුපියල් දශ ලක්ෂ 5,866 (සියයට 26) කින් ඉහල ගිය අතර, ආනයනය සඳහා දෙන ලද ණය සහ අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 2,231 (සියයට 99) කින් ඉහළ ගියේය. මේ අතර අතැති මුදල්, මහ බැංකුවේ ඇති තැන්පතු, විදේශීය ශේෂයන්, භාණ්ඩාගාර බිල්පත්හි කරන ලද ආයෝජන හා වට්ටම් කළ බිල්පත් වලින් සමන්විත වන මුළු ද්‍රවශීල වත්කම් වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 8,563 (සියයට 21) කින් ඉහළ ගියේය. මෙයින්  මහ බැංකුවෙහි ඇති තැන්පතු, වට්ටම් කළ හා විදේශීය ශේෂයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5,123 (සියයට 67) කින්, රුපියල් දශ ලක්ෂ 2,131 (සියයට 28) කින් හා රුපියල් දශ ලක්ෂ 1,756 (සියයට 15) කින් ඉහළ ගිය අතර, භාණ්ඩාගාර බිල්පත්හී කරන ලද ආයෝජන රුපියල් දශ ලක්ෂ 1,338 කින් හෙවත් සියයට 12 කින් පහළ ගියේය.

මේ අතර මුළු අත්තිකාරම්වලින් කෙටිකාලීන අත්තිකාරම් 1990 අගදී සියයට 67 සිට 1991 තුන්වන කාර්තුව අගදී සියයට 63 දක්වා පහල ගිය අතර, මැදි කාලීන (අවු.1 සිට  5 දක්වා) හා දිගු කාලීන (අවු. 5 ට වැඩි) අත්තිකාරම්හි කොටස එම කාළය තුලදී පිළිවෙළින් සියයට 16 හා 18 සිට 19 දක්වා ඉහළ ගියේය.

ණය බෙදීයාම පිළිබඳව සලකා බලන විට අපනයන, ආනයන සහ තොග හා සිල්ලර වෙළඳාම ද ඇතුලත්ව වාණිජ අරමුණු සඳහා දෙන ලද අත්තිකාරම්හි කොටස 1990 අගදී සියයට 46 සිට 1991 තුන්වන කාර්තුව අගදී සියයට 45 දක්වා පහත වැටුණි. අනෙක් අතට, එම කාළය තුලදීම රබර්, පොල්, වී, සත්ව පාළනය, කිරි පට්ටි පාලනය හා මසුන් ඇති කිරීම ඇතුලත්ව, කෘෂිකාර්මික අරමුණු සඳහා දෙන ලද අත්තිකාරම්හි කොටස සියයට 12 සිට සියයට 13 දක්වා ඉහළ ගියේය. පසුගිය වසරෙහි දක්නට ලැබුණු ප්‍රවනතාවය තවදුරටත් එලෙසම පවතිමින් කාර්මික

## 1.60 සංඛ්‍යා සටහන

### වාණිජ බැංකු තම සම්පත් ලබාගත් මාර්ග සහ ඒවා යෙදවූ මාර්ග 1990 - 1991

රුපියල් දශ ලක්ෂ

| අංශය සහ විස්තර විශ්ලේෂණය | 1989 අවසානයේ සිට 1990 අවසානය දක්වා | | 1990 අවසානයේ සිට 1991 අවසානය දක්වා | |
|---|---|---|---|---|
| | මූලයන් | භාවිතය | මූලයන් | භාවිතය |
| **1. රාජ්‍ය අංශය** | - | **2,447.6** | - | **242.3** |
| රජයේ සුරැකුම්පත් දැරීම් | - | 5,255.0 | 1,403.3 | - |
| තැන්පතු | 3871.4 | - | - | 1,083.6 |
| ආනයන බිල්පත් | - | 87.5 | - | 1,011.2 |
| කෙටි කාලීන ණය | - | 976.5 | 449.2 | - |
| අයිරාවන් | - | - | - | - |
| **2. මහ බැංකුව** | **879.6** | - | - | **7,121.2** |
| ණය ගැනීම් | 2,675.3 | - | - | 1,106.6 |
| සංචිත | - | 1,496.7 | - | 5,123.3 |
| මහ බැංකුව සුරැකුම්පත්හි ආයෝජනය | - | - | - | - |
| කැට මුදල් | - | 299.0 | - | 891.3 |
| **3. රාජ්‍ය සංස්ථා** | - | **483.9** | **4,964.8** | - |
| තැන්පතු | 1,290.2 | - | 3,405.7 | - |
| අත්තිකාරම් | - | 1,774.1 | 1,559.1 | - |
| **4. සමූපකාර** | - | **359.7** | **998.9** | - |
| තැන්පතු | 58.8 | - | 1,159.9 | - |
| අත්තිකාරම් | - | 418.5 | - | 161.0 |
| **5. අනෙකුත් දේශීය පෞද්ගලික අංශය** | - | **1,402.9** | **1,088.3** | - |
| තැන්පතු* | 10,869.2 | - | 14,253.0 | - |
| දේශීය බිල්පත් | - | 454.8 | 125.3 | - |
| ආනයන බිල්පත් | - | 63.7 | - | 1,138.5 |
| අයිරාවන් | - | 3,316.7 | - | 3,872.6 |
| ණය මුදල් | - | 8,488.8 | - | 8,172.4 |
| සුරැකුම්පත් හා බැඳුම්කරවල ආයෝජනය | 51.9 | - | - | 106.5 |
| **6. අන්තර් බැංකු ගණුදෙනු** | **622.5** | - | **273.5** | - |
| දේශීය බැංකු වල ඇති ශේෂයන් | 40.5 | - | 434.4 | - |
| දේශීය බැංකු වල තැන්පතු හා ණයගැනීම් | 582.0 | - | - | 160.9 |
| **7. විදේශීය අංශය** | - | **2,477.7** | **1,712.5** | - |
| ණය ගැණීම් | - | 24.1 | 68.3 | - |
| තැන්පතු | 2,760.3 | - | 3,310.8 | - |
| අපනයන බිල්පත් ද ඇතුළුව විදේශීය ශේෂයන් | - | 5,213.9 | - | 1,666.6 |
| **8. අනෙකුත් වත්කම් හා අනෙකුත් වගකීම්** | **5,669.7** | - | - | **1,674.5** |
| ප්‍රාග්ධන හා සංචිත | 1,295.8 | - | 2,269.3 | - |
| ස්ථාවර හා අනෙකුත් වත්කම් | 1,740.7 | - | - | 4,824.7 |
| අනෙකුත් වගකීම් | 2,633.2 | - | 880.9 | - |
| මුළු ශුද්ධ සම්පත් ලැබීම් / භාවිතය | 7,171.8 | | 9,038.0 | |

මූලයः ශ්‍රී ලංකා මහ බැංකුව

* විශේෂ ඉතිරි කිරීමේ ක්‍රමය යටතේ රාජ්‍ය අංශයේ බැංකු දෙක විසින් යොදවන ලද දිගු කාලීන තැන්පතු ද ඇතුළත් වේ.

සටහනः කළු අකුරින් දක්වා ඇති සංඛ්‍යාවන්ගෙන් එක් එක් අංශයෙහි මුළු ශුද්ධ සම්පත් ලැබීම් හෝ භාවිතය දැක්වේ.

## 1.61 සංඛ්‍යා සටහන
## ඉතිරි කිරීම් රාශිකරණය 1987 - 1991

(රුපියල් දශ ලක්ෂ)

| වර්ෂය | වාණිජ බැංකු | | | | ප්‍රා. ග්‍රා. සං. බැ. | | වාණිජ බැංකු නොවන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේශීය | | විදේශීය | | | | ග්‍රාමීය බැංකු | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | කෘෂි සේවා මධ්‍යස්ථාන | |
| | ඉතිරිකිරීම් | ස්ථාවර | ඉතිරිකිරීම් | ස්ථාවර | ඉතිරිකිරීම් | ස්ථාවර | ඉතිරිකිරීම් | ස්ථාවර | ඉතිරිකිරීම් | ස්ථාවර (අ) | ඉතිරිකිරීම් | ස්ථාවර |
| 1987 | 13,179 | 15,606 | 1,325 | 8,382 | 44 | 9 | 1,371 | 189 | 5,172 | 11,229 | 133 | 36 |
| 1988 | 16,240 | 15,476 | 1,731 | 8,371 | 90 | 14 | 1,713 | 195 | 6,381 | 11,684 | 146 | 34 |
| 1989 | 20,572 | 17,109 | 1,942 | 8,925 | 145 | 31 | 2,023 | 189 | 7,931 | 12,020 | 152 | 35 |
| 1990 | 25,347 | 25,099 | 1,965 | 9,289 | 277 | 37 | 2,279 | 218 | 9,527 | 13,577 | 173 | 23 |
| 1991 | 31,066 | 34,572 | 2,443 | 10,878 | 388 | 50 | 2,958(ඇ) | 282(ඇ) | 10,287(ආ) | 16,158(ආ) | 194 | 26 |

(අ) අනෙකුත් තැන්පතු ඇතුළත්ය
(ආ) තාවකාලික
(ඇ) 1991 සැප්තැම්බර් 30 දිනට

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අංශයට දෙන ලද ණයෙහි සාපේක්ෂ කොටස 1990 අගදී සියයට 22 සිට 1991 තුන්වන කාර්තුව අගදී සියයට 20 දක්වා තවදුරටත් පහත වැටුණි. මෙම පහත වැටීම ප්‍රධාන වශයෙන්ම තේ, රබර් හා පොල් සැකසීම සඳහා දෙන ලද අත්තිකාරම් තුලින් විද්‍යාමාන විය.

## අරමුදල් ලබාගත් මූලාශ්‍ර සහ උපයෝගී කරණය

ශුද්ධ පදනමක් මත රුපියල් දශ ලක්ෂ 1,088 ක් සපයමින් අනෙකුත් දේශීය පෞද්ගලික අංශය 1991 වර්ෂය තුලදී වාණිජ බැංකු වලට සම්පත් සැපයූ ප්‍රධානතම මූලාශ්‍රය ලෙස පැවතුණි. පසුගිය වර්ෂයේදී මෙම අංශය වාණිජ බැංකුවලට සම්පත් උපයෝගී කරගත් ප්‍රධාන අංශය විය. මෙම වෙනසට ප්‍රධාන හේතුව මෙම අංශයෙහි තැන්පතු විශාල ලෙස ඉහළ යාමයි. මේ අතර රාජ්‍ය සංස්ථා අංශය ශුද්ධ පදනමක් මත රුපියල් දශ ලක්ෂ 4,965 ක් සපයමින්, වාණිජ බැංකුවලට සම්පත් සැපයූ මාර්ගයක් බවට පත්විය. මේ අතර විදේශීය අංශය වාණිජ බැංකුවලට ශුද්ධ වත්කම් වර්ධනය සඳහා රුපියල් දශ ලක්ෂ 1,713 කින් දායක විය.

විමර්ශනයට භාජනය කරන වර්ෂය තුලදී ශ්‍රී ලංකා මහ බැංකුව ශුද්ධ පදනමක් මත රුපියල් දශ ලක්ෂ 7,121 ක වාණිජ බැංකු අරමුදල් හී ප්‍රධාන අත්තර්ග්‍රාහකයා බවට පත්විය. මෙයට ප්‍රධාන හේතුව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා යටතේ වාණිජ බැංකු තැන්පතු සැළකිය යුතු ලෙස ඉහළ යාමයි. මීට සමානවම අනෙකුත් වත්කම් (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 1,675 කින් වාණිජ බැංකුවල සම්පත් භාවිතා කරන්නා බවට පත්විය. මෙය ස්ථාවර හා අනෙකුත් වත්කම් රුපියල් දශ ලක්ෂ 4,825 ක වැඩිවීම හා ප්‍රාග්ධනය හා සංචිත රුපියල් දශ ලක්ෂ 2,269 කින් හා අනෙකුත් වගකීම් රුපියල් දශ ලක්ෂ 881 කින් වැඩිවීම මගින් හිලව් කිරීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

## තැන්පතු රාශිකරණය

1991 අවසානයේදී, බැංකු ක්‍රමය හා අනෙකුත් ඉතිරිකිරීම් ආයතන මගින් කරන ලද මුළු තැන්පතු රාශිකරණය 1990 අගදී පැවති රුපියල් දශ ලක්ෂ 87,811 හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 109,302 ක මට්ටමක පැවති අතර, එය සියයට 25 ක ඉහළ යාමක් පෙන්නුම් කළේය.

මුළු තැන්පතු රාශිකරණයෙන් සියයට 60 ක ප්‍රමාණයක් දේශීය වාණිජ බැංකු රැස්කල අතර සියයට 24 ක ප්‍රමාණය ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් රැස් කරන ලදී. සලකා බලන වර්ෂය තුලදී ස්ථාවර තැන්පතුවල වර්ධනය ඉතිරි කිරීමේ තැන්පතුවල වර්ධනය ඉක්මවා ගිය අතර, අඩු පොළියක් ලැබෙන ඉතිරි කිරීමේ තැන්පතුවලට එරෙහිව වැඩි පොළියක් ලැබෙන ස්ථාවර තැන්පතු කෙරෙහි ඉතිරි කරන්නන්ගේ කැමැත්ත මෙතුලින් පිළිබිඹු වේ.

## බැංකු සේවා පහසුකම් ව්‍යාප්තිය

### බැංකු ශාඛා ව්‍යාප්තිය

1991 සැප්තැම්බර් මස 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඒබීඑන් බැංකුව සහ ඇම්රෝ බැංකුව ඒකාබද්ධ වී ඒබීඑන් - ඇම්රෝ බැංකුව නම් විය. මේ අනුව, රට තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකු (ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හැර) සංඛ්‍යාව 23 දක්වාත්, විදේශ බැංකු සංඛ්‍යාව 17 දක්වාත් අඩුවිය. කෙසේ වුවද 1991 වසර තුලදී බැංකු ආයතන සංඛ්‍යාව සහ ශාඛා සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩිවිය. 1990 දී 12 ක්ව තිබූ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 1991 දී 15 දක්වා වැඩිවිය. ලොවපුරා වූ බී.සී.සී.අයි බැංකු කටයුතු බිඳ වැටීමෙන් අනතුරුව, එම බැංකුවේ ශ්‍රී ලංකා ශාඛාවේ කටයුතු 1991 ජූලි මස 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවන ලදී. කෙසේ වුවද, සේලාන් බැංකුවේ කළමනාකාරිත්වය යටතේ එහි සාමාන්‍ය දේශීය බැංකු කටයුතු 1991 ජූලි මස 29 වැනි දින නැවත අරඹන ලදී. 1991 වසර අවසන් වන විට මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 968 දක්වා ඉහළ නංවමින් වසර තුල ශාඛා 50 ක් පිහිටුවන ලදී. දේශීය වාණිජ බැංකු

ශාඛා 19 ක් විදේශීය වාණිජ බැංකු ශාඛා 3ක්, ප්‍රා. ග්‍රා. සං. බැංකු ශාඛා 23 ක් සහ ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛා 5 ක් ඊට ඇතුලත් විය.

දේශීය බැංකු අතුරින් ලංකා බැංකුව ප්‍රධාන ශාඛා තුනක් වලපනේ, රාජගිරිය සහ කරෙයිනගර් යන ස්ථානයන්හි පිහිටුවූ අතර, එහි තිල්දණ්ඩාහින්න සහ මූල්හල්කැලේ කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛාවන් වලපනේ ශාඛාව සමග ඒකාබද්ධ කරන ලදී. ලංකා බැංකුව නව ව්‍යාප්ති කාර්යාලයක් කොල්ලුපිටියේ විවෘත කලේය. මේ අනුව ලංකා බැංකුවේ ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 1990 පැවති 247 සිට 1991 අවසන් වන විට 250 දක්වා වැඩිවූ අතර, ව්‍යාප්ති කාර්යාල සංඛ්‍යාව එම කාලය තුළදී 12 සිට 13 දක්වා වැඩිවිය. මේ අතර කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා සංඛ්‍යාව වසර තුල 39 සිට 36 දක්වා අඩුවිය. 1990 දී 306 ක් වූ සිය ශාඛා පද්ධතිය 1991 දී 308 ක් දක්වා වැඩි කරමින් මහජන බැංකුව වඳුරඹ සහ සීදුව ප්‍රධාන ශාඛා දෙකක් විවෘත කළේය.

**1.62 වැනි සංඛ්‍යා සටහන**

**බැංකු ශාඛා ව්‍යාප්තිය 1989 - 1991**

| වර්ගීකරණය | 1989 | 1990 | 1991 |
|---|---|---|---|
| 1. ආයතන සංඛ්‍යාව | 35 | 36 | 38 |
| 1.1 වාණිජ බැංකු සංඛ්‍යාව | 24 | 24 | 23 |
| 1.1.1 දේශීය බැංකු සංඛ්‍යාව | 6 | 6 | 6 |
| 1.1.2 විදේශීය බැංකු සංඛ්‍යාව | 18 | 18 | 17 |
| 1.2 ප්‍රා. ග්‍රා. සං. බැ. සංඛ්‍යාව (අ) | 11 | 12 | 15 |
| 2. ශාඛා සංඛ්‍යාව (ආ) | 870 | 919 | 968 |
| 2.1 වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව | 712 | 742 | 763 |
| 2.1.1 දේශීය බැංකු ශාඛා සංඛ්‍යාව (ඇ) | 691 | 719 | 738 |
| 2.1.1.1. කෘ. සේ. ම. ශාඛා සංඛ්‍යාව | 45 | 38 | 36 |
| 2.1.2 විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව | 21 | 23 | 25 |
| 2.2 ප්‍රා. ග්‍රා. සං. බැ. ශාඛා සංඛ්‍යාව | 89 | 101(ඈ) | 124 |
| 2.3 ජා. ඉ. බැ. ශාඛා සංඛ්‍යාව | 69 | 76 | 81 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1985 අංක 15 දරන ප්‍රා. ග්‍රා. සං. බැ. පනත යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවන ලදී.
(ආ) ප්‍රධාන කාර්යාලද ඇතුලත්ය
(ඇ) ව්‍යාප්ති කාර්යාල, කච්චේරි ශාඛා, ගෙවීම් කාර්යාල සහ විදේශීය ශාඛා ඇතුලත් වේ. එහෙත් ප්‍රධාන ශාඛාවන් හි ව්‍යාප්ති කාර්යාල ලෙස පවත්වාගෙන යන කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා ඇතුලත් නොවේ.
(ඈ) 1990 දෙසැම්බර් 29 දින විවෘත කරණ ලද ප්‍රා. ග්‍රා. සං. බැ. ශාඛාව ඇතුළුව

වසර තුළ සීමාසහිත සේලාන් බැංකුව කුරුණෑගල, නුවරඑළිය, බලංගොඩ , ග්‍රෑන්ඩ් පාස්, අනුරාධපුර, හොරණ, ගම්පොල, බදුල්ල සහ අම්බලන්ගොඩ යන ස්ථානයන්හි ශාඛා 9 ක් විවෘත කරමින්, සිය මුළු ශාඛා සංඛ්‍යාව 26 දක්වා වැඩි කළේය. මේ අතර සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් කෝට්ටේ, මාතර සහ කෑගල්ල යන ස්ථානයන්හි නව ශාඛා තුනක් විවෘත කරන ලදී. සී/ස. ලංකා වාණිජ බැංකුව නව ශාඛා දෙකක් කටුනායක සහ නාරාහේන්පිට විවෘත කළේය. මෙම වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ සහ සීමාසහිත ලංකා වාණිජ බැංකුවේ මුළු ශාඛා සංඛ්‍යාව 1991 වසර අවසන් වන විට පිළිවෙලින් 42 සහ 21 දක්වා වැඩිවිය. මේ අතර සීමාසහිත හබීබ් බැන්ක් ඒ ජී සූරිච් සිය ශාඛා සංඛ්‍යාව 4 දක්වා වැඩිකරමින් වැල්ලවත්ත සහ කොළඹ ගුවන් තොටුපොල යන ස්ථානයන්හි අලුතින් ශාඛා දෙකක් විවෘත කළ අතර, සී/ස ග්‍රින්ඩ්ලේස් බැංකුව සිය ශාඛා සංඛ්‍යාව 3 දක්වා වැඩිකරමින් බම්බලපිටියේ නව ශාඛාවක් විවෘත කළේය. මේ අනුව 1991 අවසන් වන විට විදේශ බැංකු ශාඛා සංඛ්‍යාව 25 දක්වා වැඩිවිය.

විමසුමට ලක්වන වසර තුල ජාතික ඉතිරිකිරීමේ බැංකුව නව ශාඛා 5 ක් තලවකැලේ, මීරිගම, මහනුවර, බත්තරමුල්ල සහ දික්වැල්ල යන ස්ථානයන්හි විවෘත කරමින්, 1991 වසර අවසන් වන විට සිය මුළු ශාඛා සංඛ්‍යාව 81 දක්වා වැඩි කළේය. මේ අතර, මුළු ප්‍රා. ග්‍රා. සං. බැංකු සංඛ්‍යාව 15 දක්වා වැඩිකරමින් මාතලේ, රත්නපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි ප්‍රා. ග්‍රා. සං. බැංකු පිහිටුවන ලදී. ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් වසර තුළ ශාඛා 23 ක් විවෘත කරනු ලදුව, මුළු ප්‍රා. ග්‍රා. සං බැංකු පද්ධතිය 124 දක්වා වැඩිකරන ලදී

## නියෝජිත බැංකු

ලංකා බැංකුව සහ මහජන බැංකුව වසර තුළ ප්‍රජා ණය නියාමක ක්‍රමය තවදුරටත් ව්‍යාප්ත කළේය. මේ අනුව ලංකා බැංකුව 1991 දී ප්‍රජා ණය නියාමකයින් 470 දෙනෙකු පත්කරමින් වසර අවසන් වන විට මුළු ප්‍රජා ණය නියාමකයින් සංඛ්‍යාව 3,631 දක්වා වැඩිකළේය. වසර තුළ බැංකුව විසින් මෙම ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 57 ක් වූඅතර1991 අවසන් වන විට නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 291 දක්වා ඉහළ ගියේය. මේ අතර මහජන බැංකුව ප්‍රජා ණය නියාමකයින් 122 කු බඳවා ගැනීමෙන්, 1991 අවසන් වන විට මුළු ප්‍රජා ණය නියාමකයින් සංඛ්‍යාව 6,823 දෙනෙකු දක්වා වැඩි කළේය. විමසුමට ලක්වන වසර තුළ, බැංකුව විසින් දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 44 ක් වූ අතර, වසර අවසන් වනවිට නොපියවා පැවැති මුළු ණය ප්‍රමාණය දශලක්ෂ 194 ක් විය.

සීමාසහිත සම්පත් බැංකුව සම්පත් සේවා සංයෝජකයින් 6 දෙනෙකු පත්කරමින් 1991 අවසන් වන විට මුළු සේවා සංයෝජකයින් ගණන 72 ක් දක්වා වැඩි කළේය. වසර තුළ සම්පත් බැංකුව විසින් මෙම ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 16 ක් වූ අතර, වසර අවසන් වනවිට නොපියවා පැවැති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 16 ක්විය.

## සේවා පහසුකම්

කණ්ඩායම් ණය ක්‍රම, නව ඉතිරිකිරීමේ ක්‍රම, රහස් අංකිත ගිණුම්, කල්බදු පහසුකම් සහ විදේශ විනිමය බැංකු පහසුකම් යනාදිය හඳුන්වා දීමත් සමග වසර තුළ බැංකු සේවා සහ ඉතිරි කිරීමේ පහසුකම් තවදුරටත් පුළුල් විය. මහජන බැංකුව ජනසවිය හිමිකම්පත් ලාභීන් සඳහා "ජනසවිය හිමිකම්පත් ලාභී සමූහ ණය ක්‍රමය" නමින් නව ණය ක්‍රමයක් හඳුන්වා දුනි.

මහජන බැංකුව සහ සීමාසහිත ලංකා වාණිජ බැංකුව පිළිවෙලින් "ළමා ඉතිරි කිරීමේ ක්‍රමය" සහ "ඉසුරු" යනුවෙන් ළමුන් සඳහා ඉතිරි කිරීමේ ක්‍රම දෙකක් ඇරඹීය. ළමා ඉතිරි කිරීම් ක්‍රමය ක්‍රියාත්මක වනුයේ රුපියල් 100 සිට රුපියල් 1000 දක්වා වටිනාකම් හයකින් යුත් විශේෂයෙන් මුද්‍රණය කරන ලද ඉතිරි කිරීම් සහතික පත් මාර්ගයෙනි. කොළඹ නගරය ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයක් ලෙස තවදුරටත් දියුණු කිරීමේ පියවරක් ලෙස වාණිජ බැංකු වලට රහස් අංකිත ගිණුම් පවත්වාගෙන යාමට අවසර දෙනු ලැබිණි. මෙම පහසුකම යටතේ ශ්‍රී ලාංකික නිර්නේවාසිකයින්ට සහ විජාතිකයින්ට අනුමත කළ විදේශීය ව්‍යවහාර මුදල් වලින් ඉල්ලුම්, ඉතිරි කිරීම් සහ කාලීන තැන්පතු ගිණුම් විවෘත කළ හැකිවිය. මේ දක්වා බැංකු 14 කට රහස් අංකිත ගිණුම් පවත්වාගෙන යාමට අවසර දී ඇත.

සී/ස. හැටන් නැෂනල් බැංකු සිය ශාඛා පද්ධතිය තුලින් මෙතෙක් බැංකුවෙන් ණය පහසුකම් ලබාගත් එහෙත් තවදුරටත් මූල්‍ය පහසුකම් අවශ්‍ය වන සුළු හා මහා පරිමාණ ව්‍යවසායකයින්ට කල් බදු පහසුකම් සැලසීමට පියවර ගනු ලැබිණ. මේ අතර ලංකා බැංකුව ආනයන සහ අපනයන කරුවන්ගේ පහසුව සලකා ඉදිරි විනිමය වෙන්කිරීමේ ක්‍රමය වැඩි දියුණු කළේය. මේ අනුව බැංකුව විසින් නම්කරන ලද විදේශ මුදල් ඒකක 16 අතුරින් ඕනෑම එකකින් ඩොලරයට සාපේක්ෂව වෙන්කිරීම් කරගත හැකි ගණුදෙනු කරුවන්ට ඔවුන්ගේ ගණුදෙනුවලදී විදේශ මුදල් ඒකකයන්හි

හරස් අනුපාත උච්චාවචන හේතුකොටගෙන ඇතිවන අහිතකර බලපෑම අවුකර ගැනීමට හැකිවිය. මීට අමතරව බැංකුව සිය පරිගණක පද්ධතිය සීමාසහිත එයාර් ලංකා, සී/ස. ලංකා දුම්කොල සමාගම සහ ශ්‍රී ලංකා වණික් බැංකු සමාගම වැනි තෝරාගත් ගණුදෙනුකරුවන් වෙත සම්බන්ධ කරමින් පරිගණක පද්ධතිය ව්‍යාප්ත කළේය.

නේවාසික පුද්ගලයින්ට ඇ. එ. ජ. ඩොලර් අවම වශයෙන් 500 ක් හෝ නම් කරන ලද විදේශ මුදල් ඒකකවලින් ඒ හා සමානුපාතික ප්‍රමාණයක් සහිත නේවාසික විදේශ මුදල් ගිණුමක් ඇරඹීම සහ පවත්වාගෙන යාමට ඉඩකඩ සපයනු ලැබීය. මේ අතර අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයන ඉපයුම් වාර්ෂික වර්ධනයෙන් සියයට 5 ක ප්‍රමාණයක් නේවාසික විදේශ මුදල් ගිණුමට බැර කිරීමට ද ඉඩ දෙන ලදී. මහ බැංකුවෙන් සහනදායී ප්‍රතිමූල්‍යයන් ලබා ගැනීම සීමා කිරීම හා දේශීය වෙළෙඳපොලේ ඉහළ පොළී අනුපාතයන්ට මුහුණ දුන් අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයන තරඟකාරිත්වය වැඩි දියුණුකිරීමේ අරමුණ ඇතිව විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මාර්ගයෙන් විදේශ මුදල් ණය පහසුකම් ලබාගැනීමට අනුමැතිය ලැබුණි.

## ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

1990 අගෝස්තු මස 1 වැනි දින පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය එහි දත්ත බැංකුව පුළුල් කරමින් 1991 වසර තුළ සිය සේවා කාර්යභාරය වැඩිදියුණු කළේය. මෙම කාර්යාංශය වාණිජ බැංකු, සංවර්ධන බැංකු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් හි රු 100,000/- ඉක්මවන අව්ධිමත් ණය ගිණුම් හිමියන් (ණය දෙන ආයතනයන්හි වාරික හයක් හෝ ඊට වැඩි වාරික ගණනක් හිග තබා ඇති ණය කරුවන් හෝ වාර්තා කළ බැංකු මගින් අව්ධිමත් ණය කරුවන් ලෙස සලකන ලද අය අව්ධිමත් ණය ගිණුම් හිමියන් යනුවෙන් නිර්වචනය කර ඇත.) පිළිබඳ දත්ත තොරතුරු පද්ධතිය පුළුල් කළේය. 1991 ජුනි 30 වන දිනට පවතින තත්ත්වය පිළිබිඹු වන ලෙස දත්ත තොරතුරු සම්පූර්ණ කොට තිබිණ. මේ අතරම කාර්යාංශය සාමාජික ණය දෙන ආයතනයන්ට වාර්තා කිරීමේදී ණය කරුවන් පිළිබඳ වඩාත් පුළුල් ආවරණයක් සැපයිය හැකිවන පරිදි නිසි අයුරින් ගිණුම් පවත්වා ගෙන යන ණය ගිණුම් හිමියන් පිළිබඳ දත්ත රැස්කිරීමේ කාර්යයට මුලපිරිය. 1991 අවසන් වන විට විවිධ ණයකරුවන් 32,000 කගේ පමණ විස්තර කාර්යාංශයේ දත්ත තොරතුරු අතර විය.

**1.63 සංඛ්‍යා සටහන**

**ණය තොරතුරු කාර්යාංශය මගින් පිළියෙල කරන ලද ණය වාර්තා සංඛ්‍යාව 1991**

| මාසය | වාර්තා සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 124 |
| පෙබරවාරි | 275 |
| මාර්තු | 338 |
| අප්‍රේල් | 285 |
| මැයි | 311 |
| ජූනි | 818 |
| ජූලි | 943 |
| අගෝස්තු | 2,001 |
| සැප්තැම්බර් | 2,254 |
| ඔක්තෝබර් | 3,942 |
| නොවැම්බර් | 3,429 |
| දෙසැම්බර් | 3,270 |
| එකතුව | 17,990 |

මහ බැංකුවේ ලියාපදිංචි වූ මූල්‍ය සමාගම් කොටස්කරුවන් ලෙස බඳවාගැනීමෙන් 1991 දී කාර්යාංශයේ සාමාජිකත්වය පුළුල් විය. සමස්තයක් වශයෙන් මූල්‍ය සමාගම් 24 ක් මේ ක්‍රමය යටතේ කාර්යාංශයට බැඳුනි.

වසර තුළදී කාර්යාංශය කොටස් හිමි සාමාජික ආයතනයන්ට නොකඩවා ඉහළ යන පරිමාණයෙන් ණය තොරතුරු සැපයීය. පුද්ගලයෙකුගේ හෝ සමාගමක ගෙවීමට ඇති ණය තොරතුරු සහ ණය කරුවන් හා සම්බන්ධ වෙනත් ආයතනයන්හි තොරතුරු යනාදිය මෙම වාර්තාවන්ට ඇතුළත්විය. කාර්යාංශය මගින් පිළියෙල කරන ලද ණය වාර්තාවන් ණය දෙන ආයතනයන් වෙත ෆැක්ස් ක්‍රමයෙන් හෝ පණිවිඩකරුවන් මාර්ගයෙන් වහා යවනු ලැබීය.

ඉහත දැක්වෙන සංඛ්‍යා සටහනින් 1991 වසර තුළ කාර්යාංශය මගින් වාණිජ බැංකු, සංවර්ධන බැංකු සහ ලියා පදිංචි මූල්‍ය සමාගම්හි ඉල්ලීමට ප්‍රතිචාරයක් ලෙස සකස් කරන ලද ණය වාර්තාවන් මාසික පදනමක් යටතේ දැක්වේ.

**ග්‍රාමීය බැංකු කටයුතු සහ ණය**

රට තුළ ආර්ථික කටයුතුවල වර්ධනයත් සමග ආයතනික ණය යෝජනාක්‍රම මගින් ග්‍රාමීය අංශයට ගලායන ණය නොඩකවා වර්ධනය විය. වී වගාව සහ අතිරේක ආහාර භෝග 29 ක් සඳහා ණය දෙනු ලබන නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (න. ස ග්‍රා.ණ. ක්‍ර.) යටතේ හා පශු පාලනය, කුඩා කර්මාන්ත හා සේවා වැනි කෘෂිකර්මය හා සම්බන්ධිත කටයුතු සඳහා මැදි හා දිගු කාලීන ණය සැපයෙන ස්වයං රැකියා ණය ක්‍රමය යටතේ පුද්ගලයින්ට මුදාහළ ණය ප්‍රමාණයෙහි ඇති වූ වැඩිවීම ප්‍රධාන වශයෙන් ණය දීමේ වර්ධනයෙහිදී දක්නට ලැබුණි. මෙම ණය යෝජනා ක්‍රමවලට මහ බැංකුව මගින් දෙනු ලබන ප්‍රතිමූල්‍ය පහසුකම් මගින් පිටිවහලක් සපයනු ලැබිණි. කෙසේ වෙතත් මෙම යෝජනා ක්‍රම දෙක යටතේ ප්‍රතිමූල්‍ය පොලී අනුපාත හා ණය දීම් පොලී අනුපාත, මූල්‍ය ප්‍රතිපත්ති අවශ්‍යතාවන් මත වර්ෂය තුළදී ඉහළ දැමීමට සිදුවී තිබුණි.

**නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (න.ස.ග්‍රා. ණ. ක්‍ර)**

වී සහ අතිරේක ආහාර භෝග සඳහා ණය දෙනු ලබන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ සැලකියයුතු ලක්ෂණයක් වූයේ 1991 වර්ෂයේදී ඉහල මට්ටමක ණය ලබාදීමයි. ඊට පෙර වර්ෂයට වඩා සියයට 81 ක වර්ධනයක් වාර්තාකරමින් 1991 වර්ෂය තුලදී, න.ස.ග්‍රා.ණ. ක්‍රමය යටතේ ලබා දී තිබුණ මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,052 ක් විය. මෙම ප්‍රසාරණයට, දී ඇති ණය සංඛ්‍යාව සියයට 41 කින් වැඩිවීම හා ඊට අනුකූලව වගාකල බිම් ප්‍රමාණය වැඩිවීම මෙන්ම 1990/91 මහ කන්නය තුලදී බලපැවැත්වෙන පරිදි මූල්‍ය පහසුකම්වල ප්‍රමාණය ඉහළ දැමීමත් හේතුවිය. වර්ෂය තුළදී ණය ප්‍රමාණය සැළකිය යුතු ලෙස වැඩි වීමට දායක වූ අනෙක් සාධකය වූයේ ප්‍රා. ග්‍රා. ස. බැ. ද යෝජනා ක්‍රමයට සම්බන්ධ වීමයි. මෙම යෝජනා ක්‍රමය යටතේ දෙනු ලැබූ ණය වලින් විශාලම කොටස වී වගාව සඳහා දෙනු ලැබූ ණය වලින් සමන්විත වේ.

මහ බැංකුව න. ස. ග්‍රා. ණ. ක්‍ර. යටතේ දෙනු ලබන ණය මගින් සිදුවන අලාභවලින් සියයට 50 ක් දැරීම සඳහා ඇප සහතික සැපයීම නොකඩවා ඉදිරියට ගෙන යන ලදී. 1991 වර්ෂය අවසාන වන විට ණය සහතික යෝජනා ක්‍රමය යටතේ හානි පූරණ ගෙවීම් ලෙස මහ බැංකුව විසින් ගෙවන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 52 ක් විය.

**කෘෂි රක්ෂණ මණ්ඩලය**

1990 දී දක්නට ලැබුනු ප්‍රවනතාවය තවදුරටත් පවත්වාගෙන යමින් කෘෂි රක්ෂණ මණ්ඩලය මගින් රක්ෂණය කළ බිම් ප්‍රමාණය සියයට 35 ක ඉහළ යාමක් වාර්තා කරමින්, 1991 දී හෙක්ටයාර ප්‍රමාණය 40,000 සිට 54,000 දක්වා ඉහළ ගියේය. රක්ෂණය කරන ලද බිම් සඳහා එකතු කරගන්නා

## 1.64 සංඛ්‍යා සටහන
## නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද වගා ණය
## (1991.12.31 දිනට පැවති තත්ත්වය)

(රුපියල් දශ ලක්ෂ)

| වගා කන්නය | මහජන බැංකුව | | | ලංකා බැංකුව | | | හැටන් නැෂනල් බැංකුව | | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව | | | ලංකා වාණිජ බැංකුව | | | ලං. සං. මූ. ස. | | | දෙන ලද මුළු ණය | | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රම යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණය. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | |
| 1989/90 මහ | 76.4 | 17.5 | 93.9 | 92.2 | 59.5 | 151.7 | 13.7 | 2.9 | 16.6 | 23.2 | 13.9 | 37.1 | - | - | - | - | - | - | 205.5 | 93.8 | 299.3 |
| 1990 -යල | 54.1 | 47.9 | 102.0 | 71.4 | 41.1 | 112.5 | 1.5 | 8.2 | 9.7 | 28.1 | 29.1 | 57.2 | - | 0.1 | 0.1 | - | 0.1 | 0.1 | 155.1 | 127.4 | 282.5 |
| 1990 වගා වර්ෂය | 130.5 | 65.4 | 195.9 | 163.6 | 100.6 | 264.2 | 15.2 | 11.1 | 26.3 | 51.3 | 43.0 | 94.3 | - | 0.1 | 0.1 | - | 0.1 | 0.1 | 360.6 | 221.2 | 581.8 |
| 1990/91 මහ | 165.3 | 20.4 | 185.7 | 228.4 | 52.2 | 280.6 | 13.0 | 3.9 | 16.9 | 105.0 | 27.6 | 132.6 | 0.2 | 0.1 | 0.3 | - | - | - | 511.9 | 104.2 | 616.1 |
| 1991 යල | 66.3 | 88.8 | 155.1 | 103.9 | 57.4 | 161.3 | 3.1 | 12.9 | 16.0 | 49.1 | 53.9 | 103.0 | - | 0.5 | 0.5 | - | - | - | 222.4 | 213.5 | 435.9 |
| 1991 වගා වර්ෂය | 231.6 | 109.2 | 340.8 | 332.3 | 109.6 | 441.9 | 16.1 | 16.8 | 32.9 | 154.1 | 81.5 | 235.6 | 0.2 | 0.6 | 0.8 | - | - | - | 734.3 | 317.7 | 1,052.0 |

මූලාශ්‍ර: මහජන බැංකුව
ලංකා බැංකුව
හැටන් නැෂනල් බැංකුව
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව
සීමාසහිත ලංකා වාණිජ බැංකුව
ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව

## 1.65 සංඛ්‍යා සටහන
## තැන්පතු සහ අත්තිකාරම් - ග්‍රාමීය අංශය *

(රුපියල් දහස්)

| | සමුපකාර ග්‍රාමීය බැංකු | | කෘෂි සේවා මධ්‍යස්ථාන වල ඇති ලංකා බැංකු උප කාර්යාල | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | | ස. ණ. ස. | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 |
| 1. මුළු ඉතිරි කිරීම් | 2,497,322 | 3,448,488 | 196,496 | 220,120 | 313,871 | 437,533 | 514,253 | 588,012 |
| 1.1 ඉතිරි කිරීම් | 2,279,067 | 3,133,556 | 160,162 | 181,219 | 277,258 | 387,806 | 422,133 | 469,570 |
| 1.2 විශේෂ ඉතිරි කිරීම් | – | – | 12,690 | 12,434 | – | – | 71,052 | 78,264 |
| 1.3 ස්ථිර තැන්පතු | 218,255 | 314,932 | 23,644 | 26,467 | 36,613 | 49,727 | 21,068 | 40,178 |
| 2. ප්‍රදානය කළ මුළු ණය** | 434,718 | 583,730 | 24,589 | 208,822 | 429,780 | 595,399 | 485,341 | 608,601 |
| 2.1 කෘෂිකර්ම | 41,124 | 64,489 | 19,509 | ලැ.නො | 281,381 | 340,615 | 131,254 | 175,123 |
| 2.2 සත්ව පාලනය | 26,475 | 45,946 | 45 | ලැ.නො | 18,594 | 24,336 | 20,523 | 64,026 |
| 2.3 ධීවර | – | – | – | – | 5,348 | 7,967 | – | – |
| 2.4 කුඩා කර්මාන්ත | 30,780 | 39,310 | 865 | ලැ.නො. | 42,381 | 58,987 | 69,734 | 92,937 |
| 2.5 නිවාස, තැනීම විදුලිකරණය සහ ජල සැපයුම | 215,005 | 236,920 | 312 | ලැ.නො. | – | – | 152,753 | 152,753 |
| 2.6 ව්‍යාපෘති/වාණිජ | 16,406 | 111,055 | – | ලැ.නො | 49,290 | 80,010 | 14,699 | 62,482 |
| 2.7 වෙනත් | 104,928 | 86,010 | 3,858 | ලැ.නො | 32,786 | 83,484 | 96,378 | 61,280 |

* ග්‍රාමීය ප්‍රදේශවල පිහිටාඇති මහජන බැංකු හා ලංකා බැංකු ශාඛාවල තොරතුරු ඇතුළත් නොවේ.

** වර්ෂය තුළ දෙන ලද ණයවල මුළු වටිනාකම.

මූලයන්: මහජන බැංකුව
ලංකා බැංකුව
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු
සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති.

ලද වාරික ප්‍රමාණය 1990 දී රුපියල් දශ ලක්ෂ 10.9 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 14.8 දක්වා ඉහළ ගියේය. රක්ෂණ වන්දි ලෙස 1990 දී ගෙවන මුදල වූ රුපියල් දශ ලක්ෂ 8.8 කට එරෙහිව 1991 දී රුපියල් දශලක්ෂ 9 ක් ගෙවන ලදී

**මැදි හා දිගු කාලීන ණය අරමුදල (මැ.දි.ණ.අ.) 1 කාණ්ඩය**

සියයට 416 ක වැඩිවීමක් වාර්තා කරමින් 1990 දී මැදි හා දිගු කාලීන ණය අරමුදල යටතේ දෙනු ලැබූ ප්‍රතිමූල්‍ය ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 162 සමග සසඳන විට 1991 දී රුපියල් දශ ලක්ෂ 840 ක් ප්‍රදානය කර තිබුණි. වර්ෂය තුලදී ක්‍රියාත්මක වෙමින් පැවති ණය යෝජනා ක්‍රම 17 ක් යටතේ කෘෂිකර්මය හා ඊට අනුබද්ධිත ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා ලබාදුන් මැදි හා දිගු කාලීණ ණය වෙනුවෙන් සහභාගී වන ණය දෙන ආයතන වලට ප්‍රතිමූල්‍ය ලබා දී තිබුණි.

1991 දී මැදි හා දිගු කාලීන ණය අරමුදලෙහි තියුණු වර්ධනයක් ඇති වූයේ දීපව්‍යාප්ත ස්වයං රැකියා ණය යෝජනාක්‍රමය සඳහා විශාල ලෙස අරමුදල් ලබාගැනීම නිසාය. මෙම යෝජනාක්‍රමය යටතේ 1991 වර්ෂය සඳහා ගෘහස්ථ හා සුළු පරිමාණ කර්මාන්ත, කෘෂිකර්මාන්ත, පශු හා සම්බන්ධ කටයුතු මෙන්ම සේවාවන් සඳහා වූ මූල්‍ය යෝජනාක්‍රම මගින් රුපියල් දශ ලක්ෂ 732-ක් ප්‍රයෝජනයට ගෙන තිබුණි. මෙ යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගත් පුද්ලයින් සංඛ්‍යාව 88,000 ක් විය.

**සමුපකාර ග්‍රාමීය බැංකු වල ණය පහසුකම්**

පසුගිය වසර හා සසඳන කල සියයට 34 කින් ඉහළ යාමක් වාර්තාකරමින් 1991 වර්ෂයේදී සමුපකාර ග්‍රාමීය බැංකු මගින් ප්‍රදානයකර ඇති ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 584 ක් විය. 1991 දී සමුපකාර ග්‍රාමීය බැංකු මගින් වැඩිම ණය මුදල් ප්‍රමාණයක් ප්‍රදානයකර ඇත්තේ නිවාස, විදුලිබල සහ ජල සැපයුම් සඳහායි. පසුගිය වසර හා සසඳන විට වාණිජ කටයුතු හා යෝජනාක්‍රම සඳහා සැපයූ ණයද සැලකියයුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය.

**ග්‍රාමීය ඉතුරුම් රාශිකරණය**

1991 දී ලංකා බැංකුවේ කෘෂි සේවා මධ්‍යස්ථාන, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං. බැ.), සමුපකාර ග්‍රාමීය බැංකු සහ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති (ස.ණ.ස.) මගින් රාශිකරණය කරනු ලැබූ ග්‍රාමීය ඉතුරුම් හා ස්ථාවර තැන්පත් ප්‍රමාණයෙහි නොපියවා පැවති ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,694 ක් වූ අතර, පසුගිය වසර හා සසඳා බලනවිට එමගින් සියයට 33 ක වැඩිවීමක් වාර්තා කළේය. මුළු ඉතිරි කිරීම්වලින් සියයට 5 ක් ලංකා බැංකුවේ කෘෂි සේවා මධ්‍යස්ථාන මගින් ද, සියයට 9 ක් ප්‍රා.ග්‍රා. සං. බැ. මගින්ද සියයට 73 ක් සමුපකාර ග්‍රාමීය බැංකු මගින් සහ සියයට 13 ක් ස.ණ.ස. මගින්ද ඉතිරි කර තිබුණි.

**අනෙකුත් මූල්‍ය ආයතන**

**ඉතිරි කිරීමේ ආයතන**

වසර තුළ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් රැස්කරන ලද තැන්පතු ප්‍රමාණයෙහි වර්ධනයක් වාර්තා වූ අතර එම තැන්පතු එකතුවෙහි වර්ධන වේගය පහත වැටුණි. ඉකුත් වසරෙහිදී වූ රුපියල් දශ ලක්ෂ 3,153 ක හෙවත් සියයට 16 ක වර්ධනය හා සසඳන විට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මුළු තැන්පතු ප්‍රමාණය 1991 දී රුපියල් දශ ලක්ෂ 3,341 ක් හෙවත් සියයට 14 කින් වර්ධය විය. ඉතිරි කිරීමේ තැන්පතු සඳහා බැංකුව විසින් පිරිනමනු ලබන පොලී අනුපාතය ජූලි මාසයේ දී සියයට 16.2 සිට සියයට 14 දක්වා අඩු කිරීම සහ තුනෙන් එකක පොළී ආදායම

සඳහා වූ බදු සහනය ඉවත් කිරීම තැන්පතු වර්ධන වේගය පහත වැටීමට තරමක් දුරට හේතු විය. ස්ථිර තැන්පතුවලට වඩාත් සිත්ගන්නා සුළු අනුපාතයක් පිරිනැමීම හේතුකොටගෙන වසර තුළ තැන්පතු සංයුතියෙහි ඉතිරි කිරීමේ තැන්පතුවලින් ස්ථිර තැන්පතුවලට මාරුකිරීම් දක්නට ලැබුණි. මේ අනුව ඉතිරි කිරීමේ තැන්පතු 1990 දී වූ සියයට 20 ක වර්ධනය හා සසඳන විට 1991 දී සියයට 8 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ අතර ස්ථාවර තැන්පතු 1990 දී වූ සියයට 13 ක වර්ධනයට එරෙහිව සියයට 19 කින් ඉහළ ගියේය.

වසර තුළ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ දල ආයෝජනයන් ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, රජයේ සුරැකුම්පත් සහ ජාතික ආරක්ෂක බැඳුම්කරයන්ගෙන් සමන්විත විය. භාණ්ඩාගාර බිල්පත් හි ආයෝජනය කළ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6,143 ක් හෝ මුලු ආයෝජනයෙන් සියයට 57 ක් වූ අතර රජයේ සුරැකුම්හි යෙදවූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,959 ක් හෙවත් සියයට 28 ක් විය. රජයේ සුරැකුම්පත්වලට වඩා ආකර්ශණීය අනුපාතයක් භාණ්ඩාගාර බිල්පත්වලට ගෙවීම හේතුකොටගෙන භාණ්ඩාගාර බිල්පත්හි දිගුකාලීන ආයෝජන කෙරෙහි නැඹුරු තාවක් මින් පිළිබිඹු විය. මේ අතර 1991 දී රුපියල් දශ ලක්ෂ 966 ක් ණය වශයෙන් අනුමත කරන ලද අතර එම ප්‍රමාණයෙන් සියයට 76 ලබාදී ඇත්තේ ස්ථිර තැන්පතු වලට එරෙහිවය.

1991 වර්ෂය තුළ සේවක භාරකාර අරමුදලට දායක වූ මුදල රුපියල් දශ ලක්ෂ 105 කින් ඉහළ යමින් අරමුදලේ කටයුතු තවදුරටත් වර්ධනය විය. 1990 දී රුපියල් දශ ලක්ෂ 682 ක් වූ මුළු දායක මුදල් ප්‍රමාණය හා සසඳනවිට 1991 දී රුපියල් දශ ලක්ෂ 787 ක ප්‍රමාණයක් ලැබී තිබුණි. මේ අතර වසර අවසන් වන විට සාමාජික මුදල් ශේෂය රුපියල් දශ ලක්ෂ 1,033 කින් හෙවත් සියයට 21 කින් වර්ධනය වෙමින් රුපියල් දශලක්ෂ 5,868 ක් විය.

1991 ප්‍රථම භාගයේදී අරමුදලින් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කල ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 682 කින් ඉහළ ගියද ඉන් අනතුරුව එහි පහත වැටීමක් වාර්තා විය. වසර අවසන් වන විට භාණ්ඩාගාර බිල්පත් දැරීම් වශයෙන් රුපියල් දශ ලක්ෂ 2,160 ක් සහ රජයේ සුරැකුම් පත්හි රුපියල් දශ ලක්ෂ 1,297 ක් අරමුදලේ ප්‍රධාන ආයෝජන මාර්ගයන් විය.

**දිගු කාලීන ණය දෙන ආයතන**

1991 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ (ශ්‍රී.ල.ස.මු.ස) ක්‍රියාකාරීත්වයෙහි කැපී පෙනෙන ලක්ෂණය වූයේ සම්පත් භාවිතයේ සැලකිය යුතු ඉහළයාම හා එහි ප්‍රතිඵලයක් ලෙස අනුමත කරන ලද ණය පරිමාවේ ඉහළ යාමයි. වර්ෂය තුළදී ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.ස.ස.), ආසියානු සංවර්ධන බැංකුව (ආ.ස.බැ.) හා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත යෝජනා ක්‍රමය යටතේ ජාතික සංවර්ධන බැංකුව (ජා.ස.බැ.) සපයන ලද සම්පත්වලට අමතරව නව කොටස් නිකුතුවක් මගින් ප්‍රාග්ධන දායකත්වය ලෙස රුපියල් දශ ලක්ෂ 183 ක් හා බැඳුම්කර නිකුත් කිරීම මගින් තවත් රුපියල් දශ ලක්ෂ 314 ක් ද රැස්කර ගන්නා ලදී. මේ අතර සම්පත් සඳහා දේශීය බැංකු ක්‍රමය මත රඳා පැවැත්ම අවම විය. පසුගිය වර්ෂවලදී මෙන් අත්තිකාරම් ව්‍යුහය තුළ කාර්මික අංශයේ සංවර්ධනය සඳහා දෙන ලද අත්තිකාරම් ප්‍රමුඛත්වයක් ගත්තේය. වර්ෂය තුළදී කාර්මික අංශය සඳහා අනුමත කරන ලද නව ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 671 කින් ඉහළ ගියේය. 1991 වර්ෂය තුළදී දෙන ලද ණයෙහි කාල ව්‍යුහයෙහි වෙනස්කම් දක්නට ලැබුණ අතර දිගුකාලීන ණය රුපියල් දශ ලක්ෂ 1,318 කින් හෙවත් සියයට 148 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මැදිකාලීන ණය රුපියල් දශ ලක්ෂ 712 කින් හෙවත් සියයට 37 කින් පහත වැටීමක් වාර්තා කළේය.

රාජ්‍ය උගස් හා අයෝජන බැංකුව (රා. උ.ආ. බැ.) 1991 වර්ෂය තුළදී නිවාස හා නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් මිළදී ගැනීම සඳහා වැඩි ණය පරිමාවක් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. මෙලෙස අනුමත කරන ලද ණය ප්‍රමාණය 1990 දී රුපියල් දශ ලක්ෂ 232 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 252 දක්වා ඉහළ ගියේය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මගින් ප්‍රදානය කරන ලද සෑම ණය ප්‍රමාණයක්ම වාගේ අවුරුදු 10 ඉක්මවූ කාලයක් සඳහා සියයට 19 ක් හෝ ඊට

## 1.66 සංඛ්‍යා සටහන

### දිගු කාලීන ණය දෙන ආයතන මගින් අනුමත කරනලද හා දෙනලද ණය - අරමුණු අනුව

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| අරමුණු | ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | | ජාතික සංවර්ධන බැංකුව (2) | | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | | රක්ෂණ සංස්ථාව | | එකතුව | | අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණයෙ% | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 |
| 1. කෘෂිකර්මය | 25 | 41 | 59 | 166 | - | - | - | - | 45 | 72 | - | - | - | - | 129 | 278 | 2.7 | 4.0 |
| i. වැවිලි | 25 | 41 | - | - | - | - | - | - | - | - | - | - | - | - | 25 | 41 | 0.5 | 0.6 |
| ii. දේශීය | - | - | 59 | 166 | - | - | - | - | 45 | 72 | - | - | - | - | 104 | 237 | 2.2 | 3.4 |
| iii. කිරිපට්ටි හා සත්ව පාලනය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| iv. ධීවර කර්මාන්තය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| v. කෘෂිකර්මික කටයුතු සඳහා ඉඩම් මිලට ගැනීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2. කර්මාන්ත | 1.096 | 1.767 | - | - | - | - | - | - | 1.413 | 1.775 | - | - | - | - | 2,509 | 3,542 | 53.3 | 50.9 |
| i. වැවිලි කර්මාන්තයේ කාර්මික සැකසුම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ii. කෘෂි භෝග වල කාර්මික සැකසුම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| iii. ඉංජිනේරු කටයුතු සහ ගොඩනැගිලි ව්‍යාපාර | 19 | 11 | - | - | - | - | - | - | - | - | - | - | - | - | 19 | 11 | 0.4 | 0.1 |
| iv. පතල් කැණීම් | 3 | 19 | - | - | - | - | - | - | - | - | - | - | - | - | 3 | 19 | 0.1 | 0.3 |
| v. ආහාර පාන සහ දුම්කොළ | 412 | 571 | - | - | - | - | - | - | - | 538 | - | - | - | - | 412 | 1,109 | 8.8 | 15.9 |
| vi. රෙදිපිළි සහ ඇඟලුම් | 189 | 264 | - | - | - | - | - | - | - | 340 | - | - | - | - | 189 | 604 | 4.0 | 8.7 |
| vii. රබර් සහ සම් නිෂ්පාදන | 128 | 272 | - | - | - | - | - | - | - | 248 | - | - | - | - | 128 | 520 | 2.7 | 7.5 |
| viii. ලෝහ රසායනික ඉංජිනේරු | 150 | 355 | - | - | - | - | - | - | - | 443 | - | - | - | - | 150 | 798 | 3.2 | 11.5 |
| ix. අනෙකුත් නිෂ්පාදන | 195 | 275 | - | - | - | - | - | - | - | 206 | - | - | - | - | 195 | 481 | 4.1 | 6.9 |
| 3. සංචාරක | 70 | 144 | - | - | - | - | - | - | 68 | 135 | - | - | - | - | 138 | 279 | 2.9 | 4.0 |
| 4. වෙළඳ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 5. මූල්‍ය | 62 | 137 | 134 | - | - | - | - | - | 219 | 33 | - | - | - | - | 415 | 170 | 8.8 | 2.4 |
| i. මූල්‍ය ආයතන වලට දෙන ලද ණය | 62 | 137 | 134 | - | - | - | - | - | 150 | 25 | - | - | - | - | 346 | 162 | 7.3 | 2.3 |
| ii. ආයෝජන ණය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| iii. අනෙකුත් | - | - | - | - | - | - | - | - | 69 | 8 | - | - | - | - | 69 | 8 | 1.5 | 0.1 |
| 6. නිවාස | - | - | 70 | 66 | 232 | 252 | 14 | 52 | - | - | 314 | 617 | 21 | 26 | 651 | 1013 | 13.8 | 14.6 |
| i. නිවාස මිලදී ගැනීම් | - | - | 70 | 66 | 36 | 59 | 3 | 15 | - | - | - | - | 9 | 12 | 118 | 152 | 2.5 | 2.2 |
| ii. ඉදිකිරීම් | - | - | - | - | 196 | 193 | 11 | 37 | - | - | 314 | 617 | 12 | 14 | 533 | 861 | 11.3 | 12.4 |
| 7. ණයෙන් නිදහස් වීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 8. අනෙකුත් ණය | 104 | 126 | 443 | 734 | - | - | - | - | 319 | 819 | - | - | - | - | 866 | 1,679 | 18.4 | 24.1 |
| එකතුව (අනුමත කරන ලද) | 1,357 | 2,215 | 706 | 966 | 232 | 252 | 14 | 52 | 2,063 | 2,834 | 314 | 617 | 21 | 26 | 4,708 | 6,962 | 100.0 | 100.0 |
| ප්‍රදානය කරන ලද ණය (1) | 985 | 1,261 | 705 | 965 | 234 | 196 | 10 | 26 | - | 1,300 | 356 | 555 | 20 | 25 | 2,310 | 4,328 | 49.1 | 62.1 |
| ප්‍රදානය කරන ලද ණය අනුමත කරන ලද ණයෙහි ප්‍රතිශතයක් වශයෙන් | 73 | 57 | 100 | 100 | 101 | 78 | 71 | 50 | - | 46 | 113 | 90 | 95 | 96 | 49 | 62 | - | - |

සටහන (1) පසුගිය වර්ෂයේදී අනුමත කරන ලදුව සහ මෙම වර්ෂයේ දී දෙන ලද ණයද ඇතුළත් වේ.

(2) ණය දෙන ආයතනවලට දෙන ලද ප්‍රතිමූල්‍ය ණය සහ කොටස් ආයෝජන ද ඇතුළත් වේ.

මූලාශ්‍ර: ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව.
ජාතික ඉතිරි කිරීමේ බැංකුව.
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව.
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව.
ජාතික නිවාස සංවර්ධන බැංකුව.
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.
රක්ෂණ සංස්ථාව.

වැඩි පොලියක් යටතේ දෙන ලද අතර එයින් වැඩි කොටසක් සියයට 19 ක පොලියක් යටතේ දෙන ලදී. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මගින් 1991 දී දෙන ලද ණය සංඛ්‍යාව වන 2055 න් වැඩි කොටසක් රු. 70,000 හා රු. 500,000 අතර පරාසයකට අයත්වූ අතර රු.500.000 ඉක්මවූ ණය ප්‍රමාණය වර්ෂය තුළදී අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 12 ක් විය. 1991 වර්ෂය තුළදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු වේ සම්පත් රාශීකරණය ප්‍රාග්ධනය සඳහා රජයෙන් දෙන ලද රුපියල් දශ ලක්ෂ 100 ක දායකත්වය රුපියල් දශ ලක්ෂ 500 ක බැඳුම්කර නිකුතුව හා රුපියල් දශ ලක්ෂ 170 ක ණය ආපසු ගෙවීම හා රුපියල් දශ ලක්ෂ 69 ක කාලීන තැන්පතු වලින් සමන්විත විය.

ජාතික සංවර්ධන බැංකුව (ජා. ස. බැ.) මගින් අනුමත කරල ලද ණය පරිමාව 1990 දී රුපියල් දශ ලක්ෂ 1,936 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 2,771 දක්වා පුළුල් වූ අතර අනුමත කරන ලද ණය සංඛ්‍යාව 157 සිට 213 දක්වා ඉහල ගියේය. ඒ අනුව අනුමත කරන ලද ණයෙහි සාමාන්‍ය ප්‍රමාණය 1990 දී රුපියල් දශ ලක්ෂ 12 සිට රුපියල් දශ ලක්ෂ 13 දක්වා ඉහල ගියේය. කාර්මික අංශයේ සංවර්ධනය පිළිබඳ අවධාරණය 1991 වර්ෂය තුළදීද අඛණ්ඩව පැවති අතර දෙන ලද නව ණය ප්‍රමාණයෙන් සියයට 62 ක් මෙම අංශයට ලබදිණි. ජාතික සංවර්ධන බැංකුව මගින් මූල්‍ය පහසුකම් ලබාදෙන ලද ප්‍රධාන කාර්මික කාණ්ඩයන් වූයේ ආහාර පාන වර්ග හා දුම්කොල, (රු.ද.ල.531) රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල් සහ ලෝහ නිෂ්පාදන(රු. ද. ල. 428) රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් කර්මාන්තය (රු.ද.ල. 330) රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන ( රු. ද.ල. 243) හා අනෙකුත් නිෂ්පාදන (රු. ද. ල. 187) යන ඒවාය.

ජාතික සංවර්ධන බැංකුව මගින් 1991 වර්ෂය තුළදී අනුමත කරන ලද ණයෙන් වැඩි ප්‍රමාණයක් වන රුපියල් දශ ලක්ෂ 1,555 ක් හෙවත් සියයට 56 ක් මැදි කාලීන ණය වූ අතර ඉතිරි රුපියල් දශ ලක්ෂ 1,216 හෙවත් සියයට 44 ක් දිගු කාලීන ණය විය. මුළු ණය ප්‍රමාණයෙන් සියයට 90 ක් රුපියල් දශ ලක්ෂ 100 ට අඩු ණය විය. දෙන ලද ණයෙන් වැඩි ප්‍රමාණයක් ප්‍රදානය කරන ලද්දේ සියයට 18 සිට 19.5 දක්වා වන පොලී පරාසයක් තුළය. 1991 වර්ෂය තුළදී ජාතික සංවර්ධන බැංකුවේ සම්පත් රාශීකරණය සමන්විත වනුයේ ණය ආපසු ගෙවීම (රුපියල් දශ ලක්ෂ 1,158), ණය ගැනීම් (රුපියල් දශ ලක්ෂ 933) හා ශ්‍රී ලංකා රජයෙන් ලබා දෙන ලද ණය (රුපියල් දශ ලක්ෂ 381) මගිනි.

**මූල්‍ය සමාගම්**

1990 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද මූල්‍ය සමාගම් විධිමත් කිරීමේ වැඩ පිළිවෙළේ අරමුණ වූයේ මෙම ක්ෂේත්‍රයේ කටයුතු ශක්‍යතාවයෙන් යුතු මූල්‍ය සමාගම් වලට පමණක් සීමා කිරීමය. මේ අනුව දුර්වල තත්ත්වයේ තිබුණු මූල්‍ය සමාගම් හි කටයුතු අත්හිටුවීමටත් ශක්‍යතාවයෙන් යුතු මූල්‍ය සමාගම් තවදුරටත් ශක්තිමත් කිරීමටත් පියවර ගන්නා ලදී. ලියාපදිංචි නොකළ මූල්‍ය සමාගම් සඳහා 1988 මූල්‍ය සමාගම් ආඥාපනතේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට ලබා දෙන ලද අවුරුදු දෙකක පරිවර්තන කාලය 1990 දෙසැම්බර් 18 වන දිනෙන් අවසන් වීමත් සමග ලියාපදිංචි නොකරන ලද මූල්‍ය සමාගම් වලට මූල්‍ය කටයුතු වල නිරත වීම නීති විරෝධී ලෙස සැලකිණි. 1990 වර්ෂය අවසාන වන විට මහ බැංකුව විසින් මූල්‍ය සමාගම් 20 ක් ලියාපදිංචි කර තිබුණි. 1990 දෙසැම්බර් 18 වන දිනට ලියාපදිංචිය ලබා නොතිබූ මූල්‍ය සමාගම්වල මූල්‍ය කටයුතු අත්හිටුවීමටත් තැන්පතු වගකීම් ගෙවාදැමීම නිවේදනය කිරීමටත් විධිවිධාන යොදන ලදී. 1991 දී ලියාපදිංචි වූ මූල්‍ය සමාගම් සංඛ්‍යාව 24 ක් බවට පත්කරමින් තවත් මූල්‍ය සමාගම් 4 ක් ලියාපදිංචි කරන ලදී.

ලියාපදිංචි නොකළ සමාගම් හි කටයුතු නවතාලීමේ හේතුවෙන් මූල්‍ය සමාගම් කටයුතු පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය යටතේ තොරතුරු සැපයූ මූල්‍ය සමාගම් සංඛ්‍යාව 1991 මුල් කාර්තුවේදී 36 ක සිට 1991 අවසන් කාර්තුව වන විට 33 දක්වා පහත වැටුණි. වාර්තා කරනු ලැබූ මූල්‍ය සමාගම්වල 1991 වර්ෂය අවසානයේදී මුළු වත්කම්/වගකීම් රුපියල් දශ ලක්ෂ 1,262 කින් හෙවත් සියයට 15 කින් ඉහළ යමින් රුපියල් දශ ලක්ෂ 9,862 වී පැවතිණි. ඇතැම් සමාගම්වල

## 1.67 සංඛ්‍යා සටහන

### මූල්‍ය සමාගම් අරමුදල් ලබා ගත් මාර්ග සහ ඒවා යෙදවූ මාර්ග.

(ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ)

| ශීර්ෂය | 1990 දෙසැම්බර් 31 දිනට | 1991 මාර්තු 31 දිනට | 1991 ජුනි 30 දිනට | 1991 සැප්තැම්බර් 30 දිනට | 1991 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| අරමුදල් ලබාගත් මාර්ග | | | | | |
| 1. ප්‍රාග්ධන ගිණුම් | 960.5 | 1,149.6 | 1,100.6 | 1,124.5 | 1,152.9 |
| 2. තැන්පතු | 5,382.8 | 5,667.9 | 5,713.1 | 5,708.5 | 5,659.8 |
| 3. ණය ගැනීම් | 1,434.7 | 1,945.5 | 1,704.6 | 1,920.1 | 2,109.1 |
| 4. අනෙකුත් වගකීම් | 822.1 | 789.3 | 897.9 | 948.5 | 940.3 |
| එකතුව | 8,600.1 | 9,552.3 | 9,416.2 | 9,701.6 | 9,862.1 |
| අරමුදල් යෙදවූ මාර්ග | | | | | |
| 1. කුලීපිට ගැනුම් කටයුතු | 3,342.4 | 3,409.9 | 3,454.6 | 3,496.9 | 3,440.8 |
| 2. නොපියවන ලද ණය | 2,451.1 | 2,696.9 | 2,553.7 | 2,711.5 | 2,883.8 |
| 3. ආයෝජන | 755.7 | 954.4 | 1,031.1 | 953.1 | 1,023.8 |
| 4. අනෙකුත් වත්කම් | 2,050.9 | 2,491.1 | 2,376.8 | 2,540.1 | 2,513.7 |
| එකතුව | 8,600.1 | 9,552.3 | 9,416.2 | 9,701.6 | 9,862.1 |
| බැංකුව වෙත වාර්තා කරන ලද මූල්‍ය සමාගම් සංඛ්‍යාව | 36 | 36 | 34 | 33 | 33 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි වූ මූල්‍ය සමාගම් වලට පමණක් මූල්‍ය කටයුතු කරගෙන යාමට අවසර දී ඇති අතර අනෙකුත් මූල්‍ය සමාගම් වලට සිය කටයුතු නවතා දැමීමට නියෝග කර ඇත.

අසාර්ථකත්වය හේතුවෙන් තැන්පතුකරුවන්ගේ විශ්වාසය බිඳවැටීමේ ප්‍රතිඵලයක් ලෙස 1980 ගනන්වල අවසන් වසරවලදී දක්නට තිබූ පසුබැසීමේ ප්‍රවනතාවය හොඳ අතට හරවමින් මූල්‍ය සමාගම්වල මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 5,383 හා සසඳන විට 1991 දී එය සියයට 5 කින් වර්ධනය වෙමින් රුපියල් දශ ලක්ෂ 5,660 ක් විය. මේ අතර වාණිජ බැංකුවලින්, කොටස්කරුවන්ගෙන්, අධ්‍යක්ෂවරුන් ආදීන්ගෙන් ණය ගැනීම් වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 674 කින් හෙවත් සියයට 47 කින් ඉහළ ගියේය. විවිධ ණය ගැතියන් ඉල්ලුම් නොකළ ලාභාංශ, උපචිත පොලී සහ බදු ප්‍රතිපාදනයන් ආදිය ඇතුළු අනෙකුත් වගකීම් රුපියල් දශ ලක්ෂ 209 කින් හෙවත් සියයට 25 කින් ඉහල ගියේය.

1991 පළමු කාර්තු තුන තුළදී කුලීපිට ගැණුම් හුවමාරු කිරීම්වල නොපියවා පැවති ශේෂය නොකඩවා වර්ධනයවූ අතර හතරවන කාර්තුවේදී එය සුළු වශයෙන් පහත වැටුණි. ඒ අනුව වර්ෂය තුළදී නොපියවා පැවති කුලීපිට ගැනුම් ණය ආන්තික වශයෙන් සියයට 3 කින් ඉහළ ගියේය. නොපියවා පැවති ණය අතුරින් කල්බදු දීම් සියයට 38 ක් වූ අතර සියයට 1කට අඩු සුළු වැඩිවීමක් වාර්තා කරන ලදී. මේ අතර නොපියවා පැවති ණය රුපියල් දශ ලක්ෂ 433 කින් හෙවත් සියයට 18 කින්ද ආයෝජන රුපියල් දශ ලක්ෂ 268 කින් හෙවත් සියයට 35 කින්ද ප්‍රසාරණය විය. රුපියල් දශ ලක්ෂ 1,024 ක්වූ ආයෝජනවලින් සියයට 36 ක් භාණ්ඩාගාර බිල්පත්වලින් යුක්ත විය.

මූල්‍ය සමාගම්වල සමස්ථ ද්‍රවශීලතා තත්ත්වය අයහපත් වූ අතර තැන්පතු වගකීම් මත ද්‍රවශීල වත්කම් අනුපාතය 1990 වර්ෂය අවසානයේදී සියයට 18.4 ක සිට 1991 වර්ෂය අවසානයට සියයට 15.9 දක්වා පහත වැටුනි. මුළු තැන්පතු වගකීම් සඳහා වූ රජයේ බිල්පත්වල ආයෝජනයන් 1990 වර්ෂයේදී සියයට 7.1 ක සිට 1991 දී සියයට 6.7 දක්වා පහත වැටුණි.

1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතෙහි අංක 20 දරන වගන්තියෙහි ප්‍රතිපාදනයන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවරාගත් මූල්‍ය සමාගම් සංඛ්‍යාව 10 ක් බවට පත්කරමින් 1990 දී සහ 1991 දී තවත් මූල්‍ය සමාගම් 2 ක බැගින් පරිපාලනය හා කළමනාකාරිත්වය පවරා ගන්නා ලදී.

මධ්‍ය හා දිගුකාලීන ණය යෝජනාක්‍රමය මගින් තැන්පතුකරුවන් සඳහා සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නොකඩවා පවත්වාගෙන යන ලදී. වර්ෂය අවසානයේදී එවැනි ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 378 ක් දක්වා ඉහළ නංවමින් වර්ෂය තුළදී අර්බුද වලට මුහුණ පෑ මූල්‍ය සමාගම් 8 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 155 ක ප්‍රතිමූලය ණය සපයන ලදී.

මේ අතර මහ බැංකුව මූල්‍ය සමාගම් සමීප අධීක්ෂණය සහ මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කරන ලදී. 1991 අංක 23 දරන මූල්‍ය සමාගම් සංශෝධිත පනත මගින් මූල්‍ය සමාගමක් විසින් කල්පිරුණු තැන්පතු ආපසු ගෙවීමට අපොහොසත් වීම වරදක් ලෙස සැලකීමට කටයුතු යෙදූ අතර එවැනි වැරදි සඳහා දඬුවම් ලබාදීමටත් බලය පවරන ලදී.

**විශේෂිත මූල්‍ය ආයතන**

**වණික් බැංකු**

1991 වසර තුළ ලියාපදිංචි වණික් බැංකු සංඛ්‍යාව 3 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. සීමාසහිත මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා, සීමාසහිත පීපල්ස් මර්චන්ට් බැන්ක් සහ සීමාසහිත මර්කන්ටයිල් මර්චන්ට් බැන්ක් කලින් ලියාපදිංචි වූ ඒවා විය. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා සහ පීපල්ස් මර්චන්ට් බැන්ක් වසර තුළ වණික් බැංකු ක්‍රියාකාරිත්වයට ක්‍රියාශීලී වශයෙන් සහභාගි විය. කෙසේ වෙතත් මර්කන්ටයිල් මර්චන්ට් බැංකුව එහි සමහර කාර්යයන් අත්හළ බැවින් සිය මෙහෙයුම් කටයුතු වාර්තා කර නොතිබුණි. මුළු පිරිවැටුම දෙගුණයකින් පමණ ඉහළ නගිමින් ඉකුත් වසර හා සසඳන කළ 1991 වසර තුළ වණික් බැංකු ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස

ඉහළ නැංවිණි. මෙම බැංකුවල ප්‍රධානතම කටයුතු වූයේ වාණිජ බිල්පත් වට්ටම් කිරීම සහ කල්බදු ගැනීමය. (මේ දෙවර්ගයම අරමුදල් මත පදනම් වූ කටයුතු වේ) විශේෂිත ආයෝජන හා සම්බන්ධ කටයුතු සහ මුදල් වෙළෙඳපොළ හා සම්බන්ධ කටයුතුද වර්ෂය තුළ වූ මූලික කටයුතු අතර විය.

1.68 සංඛ්‍යා සටහන

සී/ස මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා සහ සී/ස පීපල්ස් මර්චන්ට් බැන්ක් යන බැංකුවල ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය

| | 1990 (රු. ද. ල) | 1991 (රු. ද. ල) |
|---|---|---|
| 1. බදු මගින් උපයන ලද ආදායම | 26.4 | 50.8 |
| 2. වාණිජ බිල්පත් වට්ටම් කිරීමෙන් ලද පොලිය | 58.6 | 108.1 |
| 3. පරිගණක කටයුතුවලින් ලත් ආදායම | 0.8 | 0.9 |
| 4. මූල්‍ය සහ අලෙවි උපදේශක සේවා | 1.3 | 1.0 |
| 5. ප්‍රාරක්ෂණ කොමිස් මුදල් | 0.5 | 0.8 |
| 6. රක්ෂණ කොමිස් මුදල් | 1.1 | 1.5 |
| 7. අනෙකුත් ආදායම් | 16.9 | 48.8 |
| එකතුව | 105.6 | 211.9 |

මූලයන්: මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා
පීපල්ස් මර්චන්ට් බැන්ක් ලිමිටඩ්.

## කල්බදු සමාගම්

1991 වසර තුළ සී/ස කොමර්ෂල් ලීසිං (පුද්ගලික) සමාගම, සී/ස. ලංකා ඔරික්ස් ලීසිං සමාගම හා සී/ස මර්කන්ටයිල් ලීසිං සමාගම යන ලියාපදිංචි කල් බදු සමාගම් තුනට අමතරව වෙනත් මූල්‍ය ආයතන ගණනාවක්ම කල බදු කටයුතුවල නිරත විය. 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 765 ක් වූ කල් බදු සමාගම් තුන මගින් කරනු ලැබූ කල් බදු කටයුතුවල වටිනාකම 1991 දී රුපියල් දශ ලක්ෂ 703 දක්වා අඩුවිය. මෙම අඩුවීම මූලික වශයෙන් පිළිබිඹු වූයේ රුපියල් දශ ලක්ෂ 61 කින් පහත වැටුණු කාර්මික කටයුතු වෙනුවෙන් වූ කල් බදු පහසුකම් අංශයෙනි.

ආංශික වර්ගීකරණයන් අනුව බලන කල, 1991 වසර තුළ සපයන ලද මුළු කල් බදු පහසුකම් වලින් රුපියල් දශ ලක්ෂ 267 ක ප්‍රමාණයක් හෙවත් සියයට 38 ක් ලබමින් වෙළෙඳ අංශය ප්‍රධානතම ප්‍රතිලාභී අංශය විය. උපකරණ අනුව වර්ගීකරණය කරන කළ කල්බදු පහසුකම් වලින් විශාල කොටසක් හිමිකර ගත් වාණිජ වාහන අංශය, රුපියල් දශ ලක්ෂ 358 ක් හෙවත් වසර තුළ සපයන ලද මුළු කල්බදු පහසුකම් වලින් සියයට 51 ක ප්‍රමාණයක් හිමිකර ගති. මීට අදාලව 1990 දී වටිනාකම රුපියල් දශ ලක්ෂ 306 ක් හෙවත් සියයට 40 ක් වේ.

## රක්ෂණ කටයුතු

1991 වසර තුළ රක්ෂණ සංස්ථාවන් දෙකෙහි සහ පෞද්ගලික රක්ෂණ සමාගම් තුනෙහි රක්ෂණ කටයුතු වැඩි දියුණු විය. ජීවිත රක්ෂණ අංශය සළකා බලන කල වර්ෂය තුළදී සෑම ආයතනයක්ම ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් නවතම ඔප්පු හඳුන්වා දුනි. මේ අනුව 1991 වසර තුළ ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සහ වාරික ආදායම සැලකිය යුතු ප්‍රගතියක් පෙන්විය. 1991 දී සක්‍රිය ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 285,400 සිට 292,600 දක්වා වැඩි වූ අතර, වාර්ෂික වාරික ආදායම 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 634 සිට රුපියල් දශ ලක්ෂ 785 දක්වා වැඩි විය. මේ හා සමානව සාමාන්‍ය රක්ෂණ කටයුතු විශේෂයෙන්ම ගිනි හා අනතුරු රක්ෂණ ද වසර තුළ වර්ධනය විය. මෙම අංශ දෙකෙහි වාර්ෂික වාරික ආදායම පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 44 ක් හා රුපියල්

දශ ලක්ෂ 30 කින් ඉහළ යන ලදී. කෙසේ වුවද රථවාහන රක්ෂණයෙන් ලද වාර්ෂික වාරික ආදායම වසර දෙක අතර රුපියල් දශ ලක්ෂ 723 සිට රුපියල් දශ ලක්ෂ 696 දක්වා අඩුවිය.

**මහ බැංකු කටයුතු**

1990 වසරෙහි වූ රුපියල් දශ ලක්ෂ 14,692 ක හෙවත් සියයට 23 ක වර්ධනය හා සසඳන කළ 1991 වසරෙහි මහ බැංකුවේ මුළු වත්කම්/ වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 18,373 ක හෙවත් සියයට 24 ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 95,835 ක් විය.

වත්කම් අංශයෙන් බල කල මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත (දළ) වටිනාකම සැහෙන වර්ධනයක් පෙන්වමින් 1991 දී රුපියල් දශ ලක්ෂ 12,557 කින් හෙවත් සියයට 77 කින් ඉහළ ගියේය. ජාත්‍යන්තර සංචිතය අඛණ්ඩව ඉහළ නැගි දෙවැනි වර්ෂය මෙය විය. මෙම වර්ධනය විදේශයන්හි වූ මුදල් හා ශේෂ රුපියල් දශ ලක්ෂ 12,765 කින් ඉහළ නැගීමේත්, විදේශ සුරැකුම්පත් සහ භාණ්ඩාගාර බිල්පත් දැරීම් සහ විශේෂ ගැණුම් හිමිකම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 202 කින් සහ රුපියල් දශ ලක්ෂ 6 කින් පහත වැටීමේත් ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

මහ බැංකුවේ දේශීය වත්කම් (අනෙකුත් වත්කම් හා ගිණුම් හැර) 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 4,483 ක හෙවත් සියයට 11 ක වර්ධනය හා සසඳන කළ රුපියල් දශ ලක්ෂ 5,789 ක හෙවත් සියයට 13 ක වර්ධනයක් වාර්තා කරන ලදී. විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අංක 1 ගිණුම යටතේ නැවත තක්සේරු කිරීම් හා සලාක තක්සේරු ගැළපුම් ආවරණය කිරීම සඳහා දෙන ලද රුපියල් දශ ලක්ෂ 2,949 ක විශේෂ ණය මුදල හේතුකොටගෙන රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,955 කින් (සියයට 44 කින්) ඉහළ ගියේය. මේ අතර රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් දැරීම් රුපියල් දශ ලක්ෂ 2,820 කින් (සියයට 10 කින්) ඉහළ ගියේය. අනෙක් අතට වාණිජ බැංකුවලට සහ අනෙකුත් ආයතනයන්ට දෙන ලද අත්තිකාරම් 1991 වසර තුළ රුපියල් දශ ලක්ෂ 1,986 කින් හෝ (සියයට 27 කින්) අඩුවිය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1990 වසර අවසන් වනවිට රුපියල් දශ ලක්ෂ 4,785 ක් වූ කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් ප්‍රමාණය 1991 වසර අවසන් වන විට රුපියල් දශ ලක්ෂ 1,394 දක්වා පහත වැටීමයි. වෙනත් වත්කම් සහ ගිණුම් 1990 රුපියල් දශ ලක්ෂ 3,773 ක (සියයට 32 ක) වර්ධනය හා සසඳන කළ රුපියල් දශ ලක්ෂ 27 ක සුළු වර්ධනයක් වාර්තා විය.


වගකීම් අංශයෙහි සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් සහ තැන්පතු වලින් සමන්විත මූල්‍ය වගකීම් 1991 වසරේදී රුපියල් දශ ලක්ෂ 17,682 කින් ඉහළ නැගුණි. සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 3,622 කින්ද, මහ බැංකුව වෙතැති තැන්පතු රුපියල් දශ ලක්ෂ 14,060 කින්ද ඉහළ ගියේය. විදේශ රාජ්‍ය, විදේශ බැංකු, වාණිජ බැංකු සතු තැන්පතු රජයේ සහ වෙනත් තැන්පතු පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 3,747 කින්, රුපියල් දශ ලක්ෂ 4,969 කින්, රුපියල් දශ ලක්ෂ 5,424 කින් සහ රුපියල් දශ ලක්ෂ 34 කින් ඉහළ ගිය අතර රාජ්‍ය නියෝජ්‍යත්ව ආයතන සහ අනෙකුත් ආයතන සතු තැන්පතු රුපියල් දශ ලක්ෂ 114 කින් පහත වැටිණි. වසර අවසානයේදී රජය ලද විදේශ ණයක් රජයේ තැන්පතුවල පුළුල් වැඩිවීමට මූලික වශයෙන් හේතු වූ අතර, 1991 ජනවාරි මාසයේදී ක්‍රියාත්මක කරන ලද මුදල් සංචිත අනුපාතය ඉහළ නංවමින් කළ සංශෝධනය වාණිජ බැංකුවල තැන්පතුවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. ඉකුත් වසරෙහි වූ රුපියල් දශ ලක්ෂ 5,161 ක වැඩිවීමට එරෙහිව විමර්ශනයට ලක්වන වසර තුළ මහ බැංකුව සතු වෙනත් වගකීම් සහ ගිණුම් රුපියල් දශ ලක්ෂ 443 කින් ඉහළ ගියේය.

**පොලී අනුපාතික**

පසුගිය වසර හා සසඳන කළ ඇතැම් වෙළෙඳපොළවල කෙටිකාලීන පොළී අනුපාත සුළු පහළ වැටීමේ නැඹියාවක් දැක්වුවද අඛණ්ඩව පැවති ඉහළ මූල්‍ය ප්‍රසාරණය සහ ඒ අනුව පැවති දැඩි මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් 1991 වසරෙහි කෙටිකාලීන පොළී අනුපාතයන් හි සාමාන්‍ය

# පොලී අනුපාතික

කාර්තු අවසානයට පැවති සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව.

තත්ත්වය ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර බොහෝ වෙළඳපොළවල දිගුකාලීන පොළී අනුපාතයන් ස්ථාවර විය. මූල්‍ය ප්‍රතිපත්ති තවදුරටත් දැඩි කිරීමේ පියවරක් ලෙස 1991 ජනවාරි මස බැංකු පොළී අනුපාතය වාර්ෂිකව සියයට 15 සිට 17 දක්වා වැඩි කරන ලදී.

**කෙටිකාලීන පොළී අනුපාතික**

උද්ධමන පීඩනයෙහි අඩුවීමත් සමග භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි පොළී අනුපාතිකයන් 1991 සැප්තැම්බර් මාසය දක්වා සුළු වශයෙන් පහත වැටුණ ද ඉන් අනතුරුව මූලික වශයෙන් අරමුදල් සඳහා රජයෙන් වූ ඉහළ ඉල්ලුම හේතුකොටගෙන පොළී අනුපාතික ක්‍රමයෙන් වැඩිවිය. ඒ අනුව මාස 3 සිට 12 දක්වා කල් පිරෙන කාලසීමාවන් සඳහා වූ භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් බර තබන ලද ඵලදා අනුපාතිකයන් 1990 දෙසැම්බර් මාසය අවසන් වන විට වාර්ෂිකව සියයට 17.41 -18.36 දක්වා පරාසයක සිට 1991 සැප්තැම්බර් මාසය අවසන් වන විට වාර්ෂිකව සියයට 15.79 - 16.87 දක්වා පරාසයක් තෙක් අඩු වුවද වසර අවසන් වන විට වාර්ෂිකව සියයට 16.33 - 17.43 දක්වා පරාසයක් තෙක් වැඩිවිය. මේ අතර ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ වට්ටම් හා ප්‍රතිවට්ටම් අනුපාතිකයන්ද ප්‍රාථමික වෙළඳපොළ ඵලදාවෙහි විචලනයන්ට අනුව සකස් කරනු ලැබිණ. තවදුරටත් 1991 නොවැම්බර් මාසයේ දී ද්විතීයික වෙළඳපොළ සක්‍රිය කරනු වස් ප්‍රති වට්ටම් අනුපාතය පහත හෙලීම මගින් වට්ටම් හා ප්‍රතිවට්ටම් අනුපාතයන්හි වෙනස සියයට 5 සිට සියයට 2 දක්වා අඩුකරනු ලැබිණි. මේ අනුව වට්ටම් අනුපාතය 1990 අවසානයේ වූ සියයට 15.50 සිට සියයට 14.75 දක්වා සුළු උච්චාවචනයන් තුළ පහත වැටුණු අතර ප්‍රතිවට්ටම් අනුපාතය මේ කාලය තුළ සියයට 20.5 සිට සියයට 16.75 දක්වා පහළ වැටිණි.

ඊක්ෂණ මුදල් වෙළෙඳපොළ පොළී අනුපාතිකයන් 1991 වසර තුළ සැහෙන දුරට උච්චාවචනය විය. කෙසේ වුවද අන්තර් බැංකු ඊක්ෂණ මූල්‍ය අනුපාතයන් 1991 දෙසැම්බර් මාසය අවසන් වන විට සියයට 13 - 27 දක්වා වූ පරාසයක ස්ථාවරත්වයට පත්විය. උද්ධමන පීඩනයේ අඩුවීමට සමගාමීව හා භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකයන්හි සුළු පහත වැටීමක් පිළිබිඹු කරමින් කෙටිකාලීන කල්පිරීම් සහිත ස්ථාවර තැන්පතු අනුපාතිකයන් අඩු වන්නට විය. වාණිජ බැංකුවල තුන් මසක සහ හය මසක කාලසීමාවන් වෙනුවෙන් වූ උපරිම පොළී අනුපාතිකයන් පිළිවෙළින් සියයට 22.5 සහ සියයට 21.0 සිට සියයට 18.5 සහ සියයට 18.0 දක්වා පහත වැටුණි. කෙසේ වුවද මාස 12 සහ මාස 24 යන කාලසීමාවන් සඳහා වූ උපරිම පොළී අනුපාතිකයන් පිළිවෙළින් සියයට 20 සහ සියයට 21 දක්වා විය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවද 1991 ජූලි මාසයේ දී සිය තැන්පතු අනුපාතිකය සියයට 2.2 කින් පහත හෙළමින් වාර්ෂිකව සියයට 14 දක්වා සංශෝධනය කරන ලදී. කෙසේ වුවද මෙහි මාස 12 සහ 24 වෙනුවෙන් වූ පොළී අනුපාතයන් පිළිවෙළින් වාර්ෂිකව සියයට 17 සහ 18.5 වශයෙන් නොවෙනස්ව පැවතිණි. මේ අතර මූල්‍ය ආයතනයන්හි මාස 24 ට අඩු හා මාස 24 ට වැඩි කල්පිරීම් සහිත තැන්පතු සඳහා පොළී සීමාවන් වාර්ෂිකව පිළිවෙළින් සියයට 21 සහ 24 ලෙස නොවෙනස්ව තිබිණි.

වාණිජ බැංකු විසින් තැන්පතු සහතික වෙනුවෙන් පිරිනමන ලද පොළී අනුපාතිකයන් 1990 අවසන් වන විට වූ වාර්ෂිකව සියයට 7.0- 21.7 පරාසයක සිට 1991 අවසන් වනවිට වාර්ෂිකව සියයට 9.0 - 22.5 දක්වා පරාසයක් තෙක් ආන්තික ලෙස ඉහළ නැගිණි. මේ හා සමාන තත්ත්වයක් පිළිබිඹු කරමින් මූල්‍ය සමාගම් මගින් ඉතිරිකිරීමේ සහතික පත් වෙනුවෙන් පිරිනමන ලද පොළී අනුපාතිකයන් 1990 දෙසැම්බර් මාසයේ දී වාර්ෂිකව සියයට 12 -22 දක්වා පරාසයක සිට 1991 අවසන් වන විට වාර්ෂිකව සියයට 12 -24 දක්වා පරාසයකට වෙනස් විය.

පොළී අනුපාතික රාමුවෙහි වෙනස්කම් අඩුකොට වෙළඳපොළ අනුපාතයන් හා සමානුපාත කිරීමේ අරමුණින් මහ බැංකුව කෙටි කාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා වන ප්‍රතිමූල්‍ය පොළී

අනුපාතයන් ඉහළ නංවමින් එය සංශෝධනය කරනු ලැබිණි. මහ බැංකුව විසින් වාණිජ බැංකුවල බර තබන ලද සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය සතිපතා ප්‍රකාශ කිරීම තවදුරටත් කරගෙන යන ලදී. ඉකුත් වසරෙහි වාර්ෂිකව සියයට 17.0 - 18.6 ක පරාසයක පැවැති බර තබන ලද සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය හා සසඳනවිට 1991 දී එය වාර්ෂිකව සියයට 18.7 - 19.8 ක පරාසයක් තුළ උච්චාවචනය වූ බව පෙනී යයි.

## දිගු කාලීන පොලී අනුපාතික

වසර එක, දෙක සහ හතර යන කාලසීමාවන්ගෙන් කල් පිරෙන රජයේ සුරැකුම්පත් මාලා 15 ක් 1991 වසරේදී නිකුත් කරන ලදී. එක් අවුරුදු සුරැකුම්පත් සඳහා පොළී අනුපාතය වාර්ෂිකව සියයට18 ක් වූ අතර වසරෙහි ප්‍රථම භාගය තුළ අතර දෑවුරුදු හා සිව් අවුරුදු සුරැකුම්පත් සඳහා පොළී අනුපාතය පිළිවෙළින් වාර්ෂිකව සියයට 16 ක් සහ සියයට 14 ක් විය. මෙම අනුපාතිකයන් වසරෙහි දෙවන භාගය තුළදී වාර්ෂිකව සියයට 17 සහ සියයට 16 තෙක් වැඩිවිය. සියයට10 ක පොළී අනුපාතිකයක් සහිත අවුරුදු 10 කින් කල් පිරෙන ආකාරයේ විශේෂ රුපියල් සුරැකුම්පතක්ද නිකුත් කරන ලදී මේ අතර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වාර්ෂික පොළිය සියයට 17.5 ක් වූ අවුරුදු හයකින් බේරුම් කළ හැකි ණයකර නිකුත් කළේය. මීට අමතරව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අවුරුදු එකකින්, දෙකකින් සහ හයකින් බේරුම් කළහැකි වාර්ෂිකව සියයට 18 ක, සියයට 16 ක සහ සියයට 15 ක පොළියක් සහිත ණයකර නිකුත් කළේය. කෙටි කාලීනව කල් පිරෙන සුරැකුම්පත්වල පොළී අනුපාතයන් ඉහළ මට්ටමක රඳවන ලද්දේ කෙටි කාලීන අනුපාතයන්ගේ හැසිරීම සැලකිල්ලට ගෙන වන අතර, දිගු කාලීනව කල්පිරෙන සුරැකුම්පත්වල අනුපාතයන් තීරණය කිරීමේදී මධ්‍යකාලීන උද්ධමන අපේක්ෂාවන් සැළකිල්ලට ගණු ලැබිණි. වර්ෂය තුළදී, වෙළඳපොළ පොළී අනුපාතය හා ප්‍රතිමූල්‍ය අනුපාතිකය අතර වෙනස අඩු කරමින්, මැදි හා දිගු කාලීන ප්‍රතිමූල්‍ය අනුපාතිකය සියයට 4 කින් ඉහළ යන පරිදි සංශෝධනය කරන ලදී.

ජාතික සංවර්ධන බැංකුව එහි ණය අනුපාතයන් වෙළෙඳපොළ පොළී අනුපාතයන්ට අනුකූලව තීරණය කිරීම අඛණ්ඩව සිදුකරනු ලැබිණ. මේ අනුව IV වන කුඩා හා මධ්‍යම කර්මාන්ත ව්‍යාපෘතියෙහි ප්‍රතිමූල්‍ය අනුපාතිකයන් තීරණය වූයේ වාණිජ බැංකුවල බර තබන ලද සාමාන්‍ය තැන්පතු අනුපාතිකයන් පදනම් කොටගෙනය. මේ අතර සහභාගිත්ව ණය ආයතනයන්ට (P.C.I.S.) ක්‍රියාකාරී වියදම් සහ ව්‍යාපෘති අවදානම පදනම් කොටගෙන ස්වකීය ආන්තිකයන් තීරණය කිරීමට ඉඩ දෙන ලදී. ජාතික සංවර්ධන බැංකුව 1991 අවසන් වන විට ඔවුන්ගේ සෘජු ණය දීමේදී කාලීන ණය සඳහා වාර්ෂිකව සියයට 19 ක පොළියක් අය කළේය. මේ අතර සංවර්ධන මූල්‍ය සංස්ථාව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගණුදෙනුකරුවන්ට ණය දීමේ දී අය කළ පොළිය 1990 දී වූ වාර්ෂිකව සියයට 17.5 සිට වාර්ෂිකව සියයට 19.5 දක්වා වැඩි කරනු ලැබිණි. සංවර්ධන මූල්‍ය සංස්ථාව මගින් යන්ත්‍රෝපකරණ මූල්‍යකරණය හා වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම වැනි කාලීන ණය සඳහා අය කළ අනුපාතිකය වාර්ෂිකව සියයට 20 -21 අතර විය. ජාතික ඉතිරි කිරීමේ බැංකුව වාර්ෂිකව සියයට 18 ත් 22 ත් අතර වෙනස්වන අනුපාතිකයන්ගෙන් නිවාස ණය සැපයීම තවදුරටත් කරගෙන ගියේය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සිය ණය දෙන අනුපාතිකයන් ණය මුදලෙහි අවශ්‍යතාවය හා ප්‍රමාණය අනුව වෙනස් නොවන ලෙස 1991 දෙසැම්බර් මාසයේ දී සියයට 20.5 ක් ලෙස සමරූපී කරනු ලැබිණ. මෙම සංශෝධනයට පෙර අනුපාතිකයන් ණය මුදලේ ප්‍රමාණය හා වර්ගය මත පදනම්ව වසරකට සියයට 19 - 20 දක්වා වූ පරාසයක විය.

## මූල්‍ය ප්‍රතිපත්තිය

අධික දේශීය ණය ප්‍රසාරණය හා විදේශීය වත්කම් ඉහළ නැගීම හේතුවෙන් අඛණ්ඩව පැවති මූල්‍ය ප්‍රසාරණයේ දැඩි වේගවත් බව, සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්ති ස්වරූපය 1991 වසර තුළ තවදුරටත් තිව්‍ර කිරීමට බලධාරීන්ට බලපෑම් කෙරින. උද්ධමනකාරී තත්ත්වයේ හිතකර වර්ධනයන් ඇති වුවද මූල්‍ය සහ ණය ප්‍රසාරණයේ වේගවත් ඉහළ නැගීම නිසා අතිරේක සංකෝචනාත්මක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අවශ්‍ය විය. බැංකු අනුපාතය ඉහළ නැංවීම, ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම

විධිමත් ලෙස සකස් කිරීම, වාණිජ බැංකු සංචිත අනුපාතය ඉහළ දැමීම සහ භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපළ මගින් විවට වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය තවදුරටත් ශක්තිමත් කිරීම 1991 වසර තුළ හඳුන්වා දෙන ලද ප්‍රතිපත්තිමය පියවරයන් විය. මේ අනුව 1991 ජනවාරි 04 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු අනුපාතය සියයට 15 සිට සියයට 17 දක්වා ඉහළ නැංවිණි. මෙයට අමතරව 1991 ජනවාරි 11 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වාණිජ බැංකුවල අධික ණය ප්‍රසාරණය මැඩ පැවැත්වීමේ අරමුණින් සියලුම වර්ගයන්හි තැන්පතු වගකීම් සඳහා වාණිජ බැංකුවල මුදල් සංචිත අනුපාතය සියයට 10 සිට සියයට 13 දක්වා වැඩි කරන ලදී. මේ සමගම ප්‍රතිපත්තිමය උපකරණයක් ලෙස සංචිත අවශ්‍යතාවයේ බලපැවැත්ම ශක්තිමත් කරනු වස් ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, සංචිත අවශ්‍යතාවයේ කොටසක් වශයෙන් තැබීමේ අවශ්‍යතාවය අහෝසි කෙරිණි. මේ අතර ණය ප්‍රසාරණය සීමා කරනු පිණිස 1989 මැද භාගයේදී හඳුන්වා දෙන ලද ණය පාලන පියවර විමර්ශනයට ලක්වන වසර තුළ තවදුරටත් පවත්වාගෙන යන ලදී.

මෑත අතීතයේ ක්‍රියාත්මක කැරුණු වෙළෙඳපොළ පදනම්කොටගත් ප්‍රතිපත්ති සමග මූල්‍ය කළමනාකාරිත්වයේ දී විවෘත වෙළෙඳපොළ කටයුතුවලට මෙම වසර තුළ විශේෂ අවධානය යොමු විය. මූල්‍ය අංශයේ ද්‍රවශීලතාවයෙහි ක්‍රමානුකූල කළමණාකාරිත්වයක් ඇති කිරීම සහ මූල්‍ය ප්‍රතිපත්ති පියවර කාර්යක්ෂම කරනු සඳහා 1991 මැයි මාසයේ දී බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ක්‍රියාකාරී ඒකකය පිහිටුවීම මේ සඳහා තැබූ තවත් පියවරක් විය. බලධාරීන්ගේ අවම මැදිහත්වීම සමග වෙළෙඳපොළ තත්ත්වය තුළින් ඵලදාව දැක්වෙන පරිදි මහ බැංකුව තවදුරටත් සිය ප්‍රාථමික වෙළෙඳපොළ භාණ්ඩාගාර බිල්පත් අලෙවිය සතිපතා කරගෙන ගියේය. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයෙහි තවදුරටත් වෙළෙඳපොළ මත පදනම්වීම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාථමික වෙන්දේසියේ දී ග්‍රාහක මූලාශ්‍රයන් ලත්සු තැබීමෙන් ඉවත් කිරීම හා "ටැප් ක්‍රමය" පුද්ගලයන්ට පමණක් සීමා කිරීම ද සිදුවිය. මේ අනුව 1991 අගෝස්තු මාසය ආරම්භයේ දී ග්‍රාහක මූලාශ්‍රයන් වෙත ප්‍රසිද්ධ වෙන්දේසියේ දී තීරණය වන බර තබන ලද සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකයන් පදනම් කොට භාණ්ඩාගාර බිල්පත් වෙන්කර දෙනු ලැබිණි.

උද්ධමන අනුපාතය නොකඩවා අඩුවෙමින් පැවති තත්ත්වයන් තුළ වසරෙහි බොහෝ අවස්ථාවන්හි භාණ්ඩාගාර බිල්පත් ඵලදාවෙහි අඩුවීමක් සිදු වුවද ඔක්තෝබර් මාසයේ පටන් ඉහළ නැගීමේ ප්‍රවනතාවයක් පිළිබිඹු විය. මෙලෙස 1990 වසර අවසානයේ දී වාර්ෂිකව සියයට 17.4 ක්ව පැවැති තුන් මසක කාලසීමාවක් සඳහා වූ භාණ්ඩාගාර බිල්පත් ඵලදාව 1991 ඔක්තෝබර් මාසය වන විට සියයට 15.8 ක් වුවද ඉන් අනතුරුව එම අනුපාතය ඉහළ යමින් දෙසැම්බර් මාසය වන විට සියයට 16.3 ක් විය. දිගු කාලීන කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත්වල ද මේ හා සමාන ප්‍රවනතාවක් දක්නට ලැබුණි. වසර තුළ ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළහි බැංකු නොවන පුද්ගලික අංශයට භාණ්ඩාගාර බිල්පත් අලෙවි කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් දැකිය හැකි විය.

මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් දැරීම් අඩුකිරීම අරමුණු කොටගෙන ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ සඳහා ආකර්ශනීය වට්ටම් අනුපාතයන් පිරිනැමීය. වඩාත් ක්‍රියාශීලී ද්විතියික වෙළෙඳපොළක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් වට්ටම් අනුපාතය හා ප්‍රතිවට්ටම් අනුපාතය අතර වෙනස සියයට 2 දක්වා සියයට 3 කින් අඩුකරන ලදී . වසර තුළ වට්ටම් අනුපාතය සියයට 13.25 - 14.75 දක්වා වූ පරාසයක් තුළද ප්‍රතිවට්ටම් අනුපාතය සියයට 16.75 – 18.25 දක්වා පරාසයක් තුළද විචලනය විය. ද්විතියික වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයෙහි ප්‍රසාරණයක් දක්වමින් ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ දළ විකුණුම් වසර තුළ සියයට 19 කින් ඉහළ ගිය අතර දළ මිළට ගැණුම් සියයට 74 කින් වැඩිවිය.

භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ තත්ත්වයට සතුටුදායක ප්‍රතිචාරයක් දක්වමින් බැංකු නොවන අංශයේ භාණ්ඩාගාර බිල්පත් දැරීම් 1990 අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 22,904 ක ප්‍රමාණයක සිට 1991 දෙසැම්බර් මාසය අවසන් වනවිට රුපියල් දශ ලක්ෂ 25,122 ක් දක්වා වැඩිවිය. නොපියවා පැවති භාණ්ඩාගාර බිල්පත්වලින් එයට හිමි කොටස සියයට 37.4 සිට සියයට 38.7 ක් දක්වා ඉහළ නැංවිය. කෙසේ වුවද මහ බැංකුව වෙත භාණ්ඩාගාර බිල්පත් රඳවා ගැනීම්

1990 දෙසැම්බර් මාසයේ රුපියල් දශ ලක්ෂ 27,034 ක සිට රුපියල් දශ ලක්ෂ 29,854 ක් දක්වා වැඩිවිය. මෙයට මූලික වශයෙන් හේතු වූයේ වාණිජ බැංකු වෙතැති භාණ්ඩාගාර බිල්පත් දැරීම් රුපියල් දශ ලක්ෂ 1,338 කින් අඩුවීම සහ වසරේ අවසන් කාර්තුවේ දී රුපියල් දශ ලක්ෂ 2,500 ක් අළුතින් නිකුත් කිරීමයි.

ප්‍රතිමූල්‍ය පහසුකම් නිසා මූල්‍ය ස්ථායිතාවයට හා පොළී අනුපාතිකයන්ට ඇතිවන අහිතකර බලපෑම අඩුකිරීමේ අරමුණ ඇතිව මහ බැංකුව සිය ප්‍රතිමූල්‍ය පහසුකම් විධිමත් පදනමක් මත පිහිටුවීම සඳහා ගත් පියවර කිහිපයකි. මනාව ස්ථාපිත වූ සාම්ප්‍රදායික අපනයන සඳහා වූ අපනයන ප්‍රතිමූල්‍ය පහසුකම් ක්‍රමයෙන් අඩු කිරීම, විශේෂ ප්‍රතිමූල්‍ය ක්‍රම ඉවත් කිරීම, ඉහළ එකතු කළ වටිනාකම් හා පුරෝගාමී අපනයන වෙනුවෙන් අපනයන ණය ප්‍රතිමූල්‍ය ක්‍රමය කාණ්ඩ II යටතේ සඳහා දෙනු ලබන ප්‍රතිමූල්‍ය පහසුකම් සීමාකිරීම, පවත්නා සීමිත පහසුකම් වැඩි ගැණුම්කරුවන් ප්‍රමාණයක් අතරේ බෙදා හැරීමේ අදහසින් එක් අපනයන කරුවකුගේ එක් එක් අපනයන අයිතමයක් වෙනුවෙන් සීමා පැනවීම ද ඇතුළත් වේ. පොළී අනුපාත රාමුවෙහි විකෘතිවීම අඩු කිරීම සඳහා වෙළෙඳපොළ අනුපාතිකයන් හා ගැළපෙන පරිදි ප්‍රතිමූල්‍ය පොළී අනුපාතිකයන් සකස් කිරීමටද පියවර ගන්නා ලදී. මේ අනුව 1991 ජනවාරි මාසයේ දී සියලුම ප්‍රතිමූල්‍ය අනුපාත සියයට 2 කින් ඉහළ නැංවීමෙන් සංශෝධනය කෙරිණ. 1991 අගෝස්තු මාසයේ දී සියළු ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා වන අනුපාත තවදුරටත් සියයට 2 ක ප්‍රමාණයකින් වැඩි කළ අතර අපනයන ණය ප්‍රතිමූල්‍ය ක්‍රම කාණ්ඩ අංක I සහ කාණ්ඩ අංක II සහ සහතික මිළ ක්‍රමය සඳහා 1991 දෙසැම්බර් මාසයේ නැවත සියයට 2 ක ප්‍රමාණයක් ද වැඩි කරන ලදී.

මෙම විධිමත් කිරීමේ පියවර හේතුකොටගෙන නොපියවා පැවති සමස්ත ප්‍රතිමූල්‍ය ණය ශේෂය 1990 අවසානයෙහි වූ රුපියල් දශ ලක්ෂ 7,330 සිට සියයට 27 ක වැටීමක් වාර්තා කරමින් 1991 දෙසැම්බර් මාසය අවසන් වනවිට රුපියල් දශ ලක්ෂ 5,344 ක් විය. මෙම කැපී පෙනෙන පහත වැටීම මූලික වශයෙන් පිළිබිඹු වූයේ කෙටි කාලීන පහසුකම් සඳහා දෙන ලද ප්‍රතිමූල්‍ය ණය අංශයෙහිය. කෙටි කාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් අංශයෙහි අපනයන ණය ප්‍රතිමූල්‍ය ක්‍රමය කාණ්ඩ අංක I සහ කාණ්ඩ අංක II යටතේ 1990 දෙසැම්බර් මස නොපියවන ලද ශේෂයන් රුපියල් දශ ලක්ෂ 1,576 සහ රුපියල් දශ ලක්ෂ 1,062 ක ප්‍රමාණයක සිට 1991 දෙසැම්බර් මාසය වනවිට පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 390 ක් සහ රුපියල් දශ ලක්ෂ 383 ක් තෙක් අඩුවිය. කෙසේ වුවද කෘෂි කාර්මික අවශ්‍යතාවන් සඳහා සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් ඉහළ ගිය අතර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට වී සහ වෙනත් ධාන්‍ය වර්ග මිළදී ගැනීම්/ ගබඩා කිරීම් සඳහා නව පහසුකමක් සලසන ලදී.

මැදි හා දිගුකාලීන ණය සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීමේ අපේක්ෂවෙන් බැංකුවේ මැදි හා දිගුකාලීන ණය අරමුදලට රුපියල් දශ ලක්ෂ 750 ක් මාරු කිරීමෙන් අරමුදලෙහි පවත්නා අගය රුපියල් දශ ලක්ෂ 4000 දක්වා වැඩි කරන ලදී. මෙම අරමුදල යටතේ වූ ප්‍රතිමූල්‍ය ණය උපයෝගීකරණය 1990 අවසානයේදී වූ රුපියල් දශ ලක්ෂ 2,545 ක් වූ අතර එය 1991 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 3,950 දක්වා වැඩිවිය. මේ අතර විපතට පත් මූල්‍ය සමාගම් මගින් ප්‍රයෝජනයට ගත් ප්‍රතිමූල්‍ය වටිනාකම එම කාලය තුළ රුපියල් දශ ලක්ෂ 684 සිට රුපියල් දශ ලක්ෂ 900 දක්වා වැඩිවිය. මෑත අතීතයේ මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම්වල වූ පුළුල් ව්‍යාප්තිය හා මූල්‍ය කලමණාකාරිත්වයට ඉන් ඇතිවූ බලපෑමත් සැලකිල්ලට ගනිමින් වසර තුලදී ඇතැම් විධිමත් කිරීමේ පියවර ගැනීමට සිදුවිය. මේ අනුව දුබල කර්මාන්ත වෙනුවෙන් දෙන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් අත්හිටුවීමටත් අනුමැතිය ලැබීමෙන් පසු එක් අවුරුදු කාලසීමාවක් තුළ ප්‍රයෝජනයට නොගත් සියලු අනුමතීන් අවලංගු කිරීමටත් තීරණය කරන ලදී.

## 1.69 සංඛ්‍යා සටහන

### මුදල් වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වය (1989 - 1991)

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය | ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළ | | ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ | | | | | | ද්විතියක භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ණයට දීම්/ ණයට ගැනීම් | කාලච්ඡේදය අවසානයට නොපියවා පැවති ප්‍රමාණයන් (අ) | නොපියවා පැවති මුළු බිල්පත් | නිකුත් කළ ප්‍රමාණය | පිළිගත් ප්‍රමාණය (මිලදී ගැනීම්) මහ බැංකුව | වාණිජ බැංකුව | අනෙකුත් | එකතුව | මුළු විකුණුම් | මුළු මිලදී ගැනීම් | කාලච්ඡේදය අවසානයට නොපියවා පැවති තත්වය |
| **1989** | | | | | | | | | | | |
| 1. කාර්තුව | 34,087 | 885 | 47,700.0 | 47,700.0 | 33,668.1 | 4,814.8 | 9,217.1 | 47,700.0 | 27,355 | 6,405 | 472 |
| 2 කාර්තුව | 38,885 | 1,178 | 50,322.4 | 25,164.7 | 15,255.9 | 2,499.0 | 7,409.8 | 25,164.7 | 12,258 | 6,507 | 698 |
| 3 කාර්තුව | 54,085 | 908 | 54,745.8 | 25,211.8 | 17,088.1 | 2,989.0 | 5,134.7 | 25,211.8 | 15,582 | 5,346 | 717 |
| 4 කාර්තුව | 37,051 | 790 | 57,245.8 | 19,234.5 | 11,490.6 | 3,554.2 | 4,189.7 | 19,234.5 | 15,960 | 4,991 | 713 |
| **1990** | | | | | | | | | | | |
| 1 කාර්තුව | 41,170 | 877 | 58,967.7 | 31,332.7 | 17,964.1 | 4,915.9 | 8,452.6 | 31,332.7 | 20,290 | 5,006 | 1,175 |
| 2 කාර්තුව | 49,012 | 1,188 | 61,967.7 | 30,451.9 | 15,109.6 | 5,569.4 | 9,772.6 | 30,451.7 | 15,296 | 5,184 | 425 |
| 3 කාර්තුව | 60,273 | 1,201 | 62,967.7 | 28,431.9 | 11,227.5 | 7,714.4 | 9,490.0 | 28,431.9 | 17,306 | 4,556 | 1,126 |
| 4 කාර්තුව | 64,856 | 1,988 | 67,967.7 | 29,621.4 | 16,686.0 | 7,300.6 | 5,634.9 | 29,621.4 | 14,817 | 6,351 | 1,964 |
| **1991** | | | | | | | | | | | |
| 1 කාර්තුව | 50,194 | 1,304 | 68,967.7 | 36,953.2 | 20,370.4 | 7,834.1 | 8,748.6 | 36,953.2 | 25,472 | 8,716 | 2,073 |
| 2 කාර්තුව | 54,114 | 2,167 | 70,467.7 | 34,137.2 | 14,953.8 | 4,625.5 | 14,557.9 | 34,137.2 | 16,768 | 8,584 | 1,674 |
| 3 කාර්තුව | 65,612 | 798 | 70,467.7 | 28,968.6 | 14,965.3 | 4,265.3 | 9,738.0 | 28,968.6 | 20,069 | 8,489 | 3,040 |
| 4 කාර්තුව | 54,940 | 1,592 | 72,967.7 | 31,509.1 | 18,150.4 | 5,237.5 | 8,121.2 | 31,509.1 | 18,078 | 10,898 | 1,453 |

(අ) සෑම කාර්තුවකම අවසාන සතියේදී නොපියවා පැවති ප්‍රමාණය

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## මුදල් වෙළෙඳපොළ

1991 දී මුදල් වෙළෙඳපොළේ සියළු උප වෙළෙඳපොළවල විශේෂයෙන් අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළ සැලකියයුතු ප්‍රගතියක් වාර්තා කළේය. වර්ධනය වූ විදේශීය ලැබීම්, අනේවාසික විදේශ මුදල් ගිණුම්වල ප්‍රසාරණය, නේවාසික විදේශ මුදල් ගිණුම් හඳුන්වාදීම, අපනයන කරුවන්ට විදේශීය ව්‍යවහාර මුදලින් ණය ලබාගැනීමට අවසරදීම සහ කොටස් වෙළෙඳපොළ කටයුතු වල ඉහළ මට්ටමක පැවති ප්‍රේෂණයන්, අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළ වර්ධනය සඳහා හේතු වූ ප්‍රධාන කරුණුය. මේ අතර ම.කො.ආ.කො. යටතේ වූ ව්‍යාපාර හා අනෙකුත් අනුමත කළ කාණ්ඩ සඳහා ණය ඉල්ලුම ඉහළයාම හේතුවෙන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ක්‍රියාකාරීත්වයේ වර්ධනය ද වෙළෙඳපොළ වර්ධනයෙහි සැලකියයුතු ලක්ෂණයක් විය.

## අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ

1991 දී අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළ පිරි වැටුම පසුගිය වසරට වඩා සියයට 4 කින් ඉහළ යමින් ප්‍රසාරණය විය. අතීතයේ දී මෙන්ම එහි ප්‍රධාන සාමාජිකයින් වූයේ වාණිජ බැංකුය. එයිනුත් දේශීය වාණිජ බැංකු අරමුදල් සැපයූ ප්‍රධාන සාමාජිකයන් විය. මේ අතර ඇතැම් බැංකුවල අරමුදල් ඌනතාවයන් හේතුවෙන් වරින්වර ඉල්ලුම ඉහළයාම නිසා ඒක්ෂණ මුදල් වෙළෙඳපොළහි පොළී අනුපාතිකය, තියුණු ලෙස උච්චාවචනයට ලක්විය. කලින් වර්ෂවල දී පැවති කාලීන රටාව තවදුරටත් පවතිමින් මුළු ණයදීම් හා ගැනීම් 1991 සැප්තැම්බර් මාසය දක්වා ඉහළ ගොස් ඉන්පසු පහත වැටීමක් පෙන්නුම් කෙරිණි. මේ අතර මාසය අවසාන දිනට ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළ පොළී අනුපාතයන් 1990 දී සියයට 14 - 19 පරාසයක සිට 1991 මැයි මස සියයට 16 - 39 පරාසයක් දක්වා ඉහළ ගියේය. ඉන් පසු ඇතිවූ ඇතැම් උච්චාවචනයන්ගෙන් අනතුරුව වර්ෂය අවසාන වන විට සියයට 13 - 27 පරාසයක් දක්වා අනුපාතික පහත වැටුණි.

## භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

### (අ) ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

පසුගිය වර්ෂය සමග සසඳා බලනවිට 1991 දී ප්‍රාථමික වෙළෙඳපොළේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සුළු ප්‍රමාණයකින් ඉහළ ගියේය. ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළට පසුගිය වර්ෂය තුළදී ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම වූ රුපියල් බිලියන 119.8 හා සසඳා බලනකල මෙම වර්ෂය තුළදී ඉදිරිපත් කළ ඒවායේ වටිනාකම රුපියල් බිලියන 131.6 ක් විය. මේ අතර නොපියවා පැවති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,000 කින් හෙවත් සියයට 7 කින් ඉහළ යමින් 1991 වර්ෂය අවසානයේදී නොපියවා පැවති භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් බිලියන 72.9 ක් විය.

වර්ෂයේ මුල් කාර්තු තුනේදී නාමික පොළී අනුපාතිකය යම් ප්‍රමාණයකින් අඩුවූවත් වෙළෙඳ පොළෙහි පැවති ආකර්ශණීය මූර්ත පොළී අනුපාතිකයන් හේතුවෙන් බැංකු නොවන අංශය විසින් භාණ්ඩාගාර බිල්පත්වල කරනු ලැබ ආයෝජනයන් වර්ෂය තුළදී තවදුරටත් ඉහළ ගියේය. බැංකු නොවන අංශයේ ආයෝජනයන් 1990 අවසානයේදී රුපියල් බිලියන 26.7 සිට 1991 අවසානය වන විට රුපියල් බිලියන 28.8 දක්වා සියයට 8 කින් වර්ධනය විය. මෙම අංශයෙහි ප්‍රධාන ආයෝජකයන් වූයේ අනුමත කරනු ලැබූ අර්ථසාධක අරමුදල් (රුපියල් බිලියන 9.8) රාජ්‍ය සංස්ථා (රුපියල් බිලියන 7.7) සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව (රුපියල් බිලියන 7.3) යි. මේ අතර වාණිජ බැංකු විසින් දරණු ලැබූ භාණ්ඩාගාර බිල්පත් 1990 අවසානයේදී රුපියල් බිලියන 10.6 ක සිට 1991 වර්ෂය අවසාන වනවිට රුපියල් බිලියන 9.2 දක්වා අඩුවිය. අනික් අතට මහ බැංකුව විසින් දැරූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1990 වර්ෂය අවසානයේදී රුපියල් බිලියන 30.7 ක සිට 1991 වර්ෂය අවසාන වන විට රුපියල් බිලියන 35.0 දක්වා වැඩිවිය.

භාණ්ඩාගාර බිල්පත්වල පොළී අනුපාතය වඩාත්ම වෙළෙඳපොළ මගින් තීරණය කරනු සඳහා අරමුදල් ලබාගත් ග්‍රාහක මූලාශ්‍රවලට ප්‍රාථමික බිල්පත් වෙන්දේසියේදී ලන්සු තැබීමට අවසර නොදෙන ලද අතර පුද්ගලයන් සඳහා "ටැප් ක්‍රමය" සීමා කරණ ලදී. භාණ්ඩාගාර බිල්පත් හි ග්‍රාහකමූලාශ්‍ර ආයෝජකයන් සඳහා වෙන්දේසියේදී බර තැබූ සාමාන්‍ය පොළී අනුපාතිකය පිරිනමන ලදී. මේ අතර "ටැප් ක්‍රමය" මගින් භාණ්ඩාගාර බිල්පත් අලෙවියේ සමුච්චිත වටිනාකම 1990 දී රුපියල් බිලියන 8.1 සිට1991 දී රුපියල් බිලියන 6.1 දක්වා අඩු විය.

## (ආ) ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

ආයෝජකයන්ගේ තාවකාලික අතිරික්ත අරමුදල් ප්‍රයෝජනවත් ලෙස යෙදවීම සඳහා වූ මාධ්‍යයක් ලෙස වෙළෙඳපොළ වඩාත් කාර්යක්ෂමව යොදා ගැනීම පිළිබිඹු කරමින් ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි ක්‍රියාකාරිත්වය වර්ෂය තුළදී තවදුරටත් ප්‍රසාරණය විය. ඒ අනුව මහ බැංකුවේ වාර්ෂික භාණ්ඩාගාර බිල්පත් අලෙවිය 1990 දී රුපියල් බිලියන 67.7 සිට 1991 දී රුපියල් බිලියන 80.4 දක්වා ඉහල ගියේය. ඒ අතර මහ බැංකුවේ මිලදී ගැනුම් මුළු ප්‍රමාණය රුපියල් බිලියන 21.1 ක සිට රුපියල් බිලියන 36.7 දක්වා ඉහළ ගියේය. ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ කටයුතු ක්‍රියාශීලී කිරීම සඳහා වට්ටම් හා ප්‍රතිවට්ටම් අනුපාතය අතර පරතරය සියයට 5 ක සිට සියයට 2 දක්වා අඩු කරමින් මහ බැංකුව විසින් ප්‍රතිවට්ටම් අනුපාතිකය පහතට නැඹුරු වන ලෙස සකස් කරණ ලදී. වර්ෂය තුළ බොහෝ මාසවලදී ශුද්ධ විකුණුම් තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළෙහි පොළී අනුපාතිකයන් ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි උච්චාවචනයන් පිළිබිඹු වන පරිද්දෙන් නොකඩවාම සකස් කරන ලදී. ඒ අනුව 1990 වර්ෂය අවසානයේදී වට්ටම් අනුපාතිකය සියයට 15.50 ක සිට 1991 වර්ෂය අවසාන වන විට සියයට 14.75 දක්වා යම් දුරකට ආන්තික වශයෙන් උච්චාවචනයකට ලක්වූ අතර ප්‍රතිවට්ටම් අනුපාතිකය සියයට 20.5 ක සිට සියයට 16.7 දක්වා එම කාලය තුළදීම පහත බසින ලදී.

## අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළ

ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු සමග ගණුදෙනු සඳහා කලින් තීරණය කළ අනුපාතිකයකට ශ්‍රී ලංකා රුපියල් සඳහා ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් එතැන් විකිණීමේ හා මිළදී ගැනීමේ කටයුතු සඳහා සහභාගීවීම නොකඩවා කරගෙන යන ලදී. දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරී කිරීම අරමුණුකොටගෙන 1991 දෙසැම්බර් 10 වන දින හඳුන්වා දුන් ඇ.එ.ජ.ඩොලර් සඳහා වන දිනපතා විනිමය අනුපාතිකය සකස් කිරීමේ නව ක්‍රමය අනුව මහ බැංකුව විසින් මිළදී ගැනීමේ සහ විකිණීමේ අනුපාතයන් වෙළෙඳපොළ තත්ත්වයන් සහ එයට සම්බන්ධ අනෙකුත් සාධක ද මත පදනම් වී ඇති අතර දවස ආරම්භයේදී ප්‍රකාශ කරනු ලබන ඩොලර් සඳහාවන මිලට ගැනීමේ සහ විකිණීමේ අනුපාතිකයන් වෙනස් කරනු ඇත. 1991 වර්ෂය අවසානයේදී ඇ. එ.ජ. ඩොලරයක් සඳහා මිලට ගැනීමේ හා විකිණීමේ එතැන් විනිමය අනුපාතිකය පිළිවෙළින් රු 42.5650 සහ රු 42.5950 විය. ඒ අතර එතැන් මධ්‍ය අනුපාතිකය රු.42.58 ක් විය.

ඉදිරි මාස 6 ක් ආවරණය වන ලෙස ඇ. එ. ජ. ඩොලර් ඉදිරි වෙළෙඳපොළ ගණුදෙනු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් විය. වර්ෂය අවසාන වන විට මහ බැංකුව විසින් මාසයක් සඳහා වන ඩොලර් ඉදිරි මිළදී ගැනීම් (තේරීම් සහිත) ඩොලර් සඳහා වන එතැන් මධ්‍යම අනුපාතයට ශත 50 ක් පහළ මට්ටමක මිළදී ගෙන තිබුණු අතර මාස තුනක් සඳහා ඩොලර් ඉදිරි මිලට ගැනීම් (අවසාන මාසයේ තේරීම සහිත) ඇ. එ. ජ. ඩොලරයකට එතැන් මධ්‍යා අනුපාතයෙන් රු:1 කට අඩු මට්ටමකට මිළට ගෙන තිබුණි. 1991 වර්ෂයේදී ඇ. එ. ජ. ඩොලර් දශ ලක්ෂ 93 ක හෙවත් සියයට 20 ක වර්ධනයක් වාර්තා කරමින් මහ බැංකුවේ එතැන් මිළදී ගැනීම් එ. ජ. ඩොලර් දශ ලක්ෂ 554 ක් වූ අතර එතැන් විකිණීම් වසර තුළදී ඇ. එ. ජ. ඩොලර් දශ ලක්ෂ 110 ක් හෙවත් සියයට 60 ක වර්ධනයක් වාර්තා කරමින් ඇ. එ. ජ. ඩොලර් දශ ලක්ෂ 293 ක් විය.

## අක්වෙරල වෙළෙඳපොළ

1991 වර්ෂ තුළදී ප්‍රමාණය සහ සීමාව අතින් වාණිජ බැංකුවල විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි. ව්‍ය. මු. බැ. ඒ) යන්හි අක්වෙරළ බැංකු කටයුතු නොකඩවා වර්ධනය විය. 1991 වර්ෂය අවසාන වන විට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන් 22 හි මුළු වත්කම්/වගකීම් රුපියල් දශ ලක්ෂ 4,026 කින් හෙවත් සියයට 11 කින් වර්ධනය වෙමින් රුපියල් දශ ලක්ෂ 39,365 ක් (ඇ. .එ. ජ. ඩොලර් 924.5) විය. වි. ව්‍ය. මු. බැ. ඒකක මගින් අපනයනකරුවන්ට දෙනු ලබන විදේශ විනිමය ණය පහසුකම් සැලසීමත් සමග එම ඒකක මගින් දේශීය අනෙකුත් අනුමතකළ කාණ්ඩ සඳහා දෙනු ලැබූ ණය පහසුකම් 1991 වර්ෂය තුළදී ඉහළ ගියේය. වර්ෂය අවසානය වන විට වි. ව්‍ය.මු. බැ. ඒකක 7 ක් අපනයන කරුවන් සඳහා මෙම පහසුකම් සපයා තිබුණි. ඒ අනුව මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යාපාර සහ අනෙකුත් අනුමත කළ කාණ්ඩ සඳහා අනුමත කළ ණය සහ අත්තිකාරම් පිළිවෙළින් සියයට 62 ක් සහ සියයට 46 බැගින් ඉහළ ගියේය. වගකීම් අංශයෙහි අනේවාසිකයන්ගේ බැංකු කාණ්ඩයෙහි තැන්පතු සහ ණය ගැනීම් මුළු සම්පත්වලින් වැඩි ප්‍රමාණයක් වීම නොකඩවා පවත්වා ගනිමින් 1991 වර්ෂය අවසාන වන විට මුළු වගකීම්වලින් සියයට 41 ක් දරන ලදී.

## මුදල් වෙළෙඳපොළ උපකරණ

පසුගිය වසරවලදී මෙන්ම 1991 වර්ෂය තුළදීද තැන්පතු සහතික සහ භාණ්ඩාගාර බිල්පත් මුදල් වෙළෙඳපොළෙහි ප්‍රධාන උපකරණය ලෙස යොදා ගැනීම නොකඩවා සිදුවිය. වාණිජ බැංකු වලින් හා මූල්‍ය සමාගම් මගින් නිකුත් කළ තැන්පතු සහතිකවල නොපියවා පැවති ප්‍රමාණය පසුගිය වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 2,413 ක සිට 1991 වර්ෂය අවසාන වන විට රුපියල් දශ ලක්ෂ 3,051 දක්වා ඉහළ ගොස් තිබිණි. 1991 වර්ෂයේදී වාණිජ බැංකු විසින් තැන්පතු සහතික සඳහා පිරිනැමූ වාර්ෂික පොළී අනුපාතිකයන් සියයට 9 ත් 22.5 ත් අතර උච්චාවචනය විය. ඒ හා සැසැඳුණු පසුගිය වර්ෂයේ පොළී අනුපාතිකය වාර්ෂිකව සියයට 8 ත් 22.5 ත් අතර පැවතිණි. මූල්‍ය සමාගම් විසින් තැන්පතු සහතික සඳහා ප්‍රදානය කළ පොළී අනුපාතිකයන් 1991 වර්ෂය අවසාන වන විට සියයට 12 සිට 24 ත් අතර ඉහළ පරාසයක පැවති අතර 1990 දී එය සියයට 12 සිට 22 ත් අතර පරාසයක පැවතිණි.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ

### (අ) සමස්ත උපනතීන්

කොටස් වෙළෙඳ පොළ ක්‍රියාකාරීත්වයන් සහ සංවර්ධනයන් සලකා බලනකල 1991 වසර සැලකියයුතු වසරකි. කොටස් වෙළෙඳපොළ සියළුම දර්ශකයන් වර්ෂය තුළ කොටස් ගණුදෙනු පිළිබඳ සැලකියයුතු සංවර්ධනයක් පෙන්නුම් කරයි. ආර්ථික ක්‍රියාකාරීත්වයෙහි අඛණ්ඩ වර්ධනයද කොටස් වෙළෙඳපොළ වර්ධනය කරනු වස් අධිකාරීන් විසින් සපයන ලද පහසුකම් ද ගනු ලැබූ පියවරයන්ද මෙම සතුටුදායක වර්ධනය සඳහා දායක වූනු ප්‍රධාන සාධක විය.

කොටස් වෙළෙඳපොළෙහි වෙළෙඳ කටයුතුවල තියුණු ඉහල නැගීමක් පිළිබිඹු කරමින් අලෙවි කරන ලද කොටස්වල මුළු පිරිවැටුම 1990 දී රුපියල් දශ ලක්ෂ 1,563 ක සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 4,944 දක්වා ඉහළ ගිය අතර එම කාලය තුළදී අලෙවි කරන ලද මුළු කොටස් ගණන දශ ලක්ෂ 42 ක සිට දශ ලක්ෂ 95 දක්වා ඉහළ ගියේය. එම කාලය තුළදීම කොළඹ කොටස් හුවමාරුවෙහි සමස්ත කොටස් මිල දර්ශකය (1985= 100) 1990 වසර අවසානයේදී 384 ක සිට 1991 වසර අවසානය වන විට 838 දක්වා ඉහළ ගිය අතර එම කාලසීමාව තුළදීම සංවේදී කොටස් මිළ දර්ශකය (1985 =100) 680 ක සිට 1,199 දක්වා පිළිවෙළින් සියයට 118 කින් සහ සියයට 76 කින් ඉහළ ගියේය.

1991 වර්ෂය තුළදී නව සමාගම් පහක් කොළඹ කොටස් හුවමාරුවෙන් මිල කියුම් ලබාගත්තා ලදී. මෙම නව මිල කළ සමාගම් වලට බැංකු සහ මූල්‍ය, පාවහන් සහ රෙදි පිළි, හෝටල් සහ සංචාරක, කර්මාන්ත සහ වෙළෙඳ යන අංශයන්ට අයත්වේ. විමසුමට ලක් කැරුණු මෑත කාලීන ප්‍රවනතාවයන් අනුව කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 1991 දී දෙගුණයකට වඩා ඉහල යමින් 1990 දී වූ රුපියල් දශ ලක්ෂ 36,880 ක සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 82,700 දක්වා ඉහළ ගියේය.

කොටස් වෙළෙඳ පොළේ ඉහළ මට්ටමක පැවති ක්‍රියා කාරීත්වය තුළ 1991 සැප්තැම්බර් මසදී කොටස් හුවමාරු කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව විසින් නව නීති රීති මාලාවක් සමග පරිගණක ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. මෙම නව ක්‍රමය, මිල කරණ ලද සුරැකුම්පත් ගණු දෙනු නිරවුල් කිරීමේ සහ තීන්දු කිරීම් පිණිස වූ සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය ඒකාබද්ධ ක්‍රමයකින් සමන්විත වේ. මෙම නව ක්‍රමය යටතේ සංශෝධිත පිළිවෙත් සඳහා පහසුකම් සපයනු වස් කොළඹ කොටස් හුවමාරුව මගින් සම්පූර්ණයෙන්ම දායකත්වය සැපයූ එහි උප ආයතනයක් ලෙස සීමාසහිත සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම් (පෞද්ගලික) සමාගම 1991 දී පිහිටුවන ලදී. 1991 දෙසැම්බර් මස අවසාන වන විට මෙම ක්‍රමය යටතේ ලියාපංදිංචි වුනු සමාගම් ගණන 33 ක් විය.

1991 වර්ෂය තුළදී කොටස් වෙළෙඳපොළෙහි තවත් සැලකිය යුතු වූ සංවර්ධනයක් නම් ආයෝජකයින්ට, විශේෂයෙන් කුඩා පරිමාණ ඉතිරි කරන්නන්ට විශ්වාසදායක ආයෝජ්‍ය.යන්ට ඉඩකඩ සපයමින් ඒකක භාරයන් පිහිටුවීමයි. 1987 අංක 36 දරණ සුරැකුම්පත් සභා පනතට 1991 අංක 26 දරණ පනත මගින් කරණ ලද සංශෝධනයට අනුව සුරැකුම්පත් හා හුවමාරු කොමිසමට ඒකක භාරයන් පිහිටුවීම සඳහා අවසර පත්‍ර ප්‍රදානය කිරීමට බලය පැවරුණි. 1991 දෙසැම්බර් මස අවසාන වන විට සීමාසහිත ජාතික වත්කම් කළමනාකරණ (පෞද්ගලික) සහ සීමාසහිත සී. කේ. එන්. අරමුදල් කළමනාකරණ (පෞද්ගලික) යන සමාගම් විසින් පාලනය කරනු ලබන පිළිවෙලින් ජාතික ස්කන්ධ අරමුදල් සහ පිරමිඩ් ඒකක භාරය නමින් වූ ඒකක භාර දෙකක් ලියා පදිංචි කර තිබුණි. මෙම ඒකක භාරයන් දෙකම පිහිටුවා තිබුනේ විදේශීය මූල්‍ය ආයතන සමග සහයෝගීව ක්‍රියාකරන දේශීය මූල්‍ය ආයතන් කණ්ඩායම් දෙකක් විසිනි. මේ අතර අනුමත කරන ලද කලාපීය අරමුදල් සංඛ්‍යාව 68 දක්වා ඉහළ නංවමින් කලාපීය අරමුදල් විශාල සංඛ්‍යාවක් ද, 1991 වර්ෂය තුළදී අනුමැතිය ලබාගත්තා ලදී.

## (ආ) ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ

නිකුත් කරන ලද නව කොටස් සංඛ්‍යාව සහ වටිනාකම අනුව බලන කල ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය 1991 වර්ෂය තුළදී නොඩවා වර්ධනය විය. 1989 හා 1990 දී පැවති නව නිකුතුන් පිළිවෙලින් 2 සහ 1 සමග සසඳන විට 1991 දී නව නිකුතුන් 5 ක් විය. 1991 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 121.5 ක් වටිනා නව කොටස් දශ ලක්ෂ 12.1 ක් වෙළෙඳපොළට ඉදිරිපත් කරන ලදී. මෙම නව නිකුතුන්ගෙන් දෙකක් පෞද්ගලික කරණය කරන ලද සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගමත්, සීමාසහිත පූගොඩ ටෙක්ස්ටයිල් ලංකා සමාගම විසිනුත් ඉදිරිපත් කෙරිණි. මෙම සමාගම් දෙක මගින් පිළිවෙලින් කොටස් දශ ලක්ෂ 1.8 ක් සහ දශ ලක්ෂ 3 ක් ඉදිරිපත් කරන ලද අතර මෙම නව නිකුතුන් සියල්ලෙහිම කැපී පෙනෙන ලක්ෂණය වූයේ වෙළෙඳපොලේ කොටස් සඳහා විශාල ඉල්ලුමක් පවතින බව පිළිබිඹු කරමින් අධිදායකත්වයක් දැක්වීමයි.

## ඇ) ද්විතීයික කොටස් වෙළෙඳපොළ

ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ මෙන්ම ද්විතීයික කොටස් වෙළෙඳපොළද සැලකිල්ලට ලක්කෙරෙන කාලච්ඡේදය තුළදී සැලකියයුතු වර්ධනයක් වාර්තා කරන ලදී. ද්විතීයික කොටස් වෙළෙඳපොළෙහි අලෙවි කරනු ලැබූ කොටස් සංඛ්‍යාව 1990 දී දශ ලක්ෂ 41 ක සිට 1991 දී දශ ලක්ෂ 95 ක් වෙමින් වර්ෂය තුළදී දෙගුණයකට වඩා ඉහළ ගිය අතර එම කොටස්වල වටිනාකම

රුපියල් දශ ලක්ෂ 1,563 ක සිට රුපියල් දශ ලක්ෂ 4,944 දක්වා ඉහළ ගියේය.

කොටස් වර්ගීකරණ විශ්ලේෂණයට අනුව බැංකු මූල්‍ය සහ රක්ෂණ යන අනුකාණ්ඩ වැඩිම කොටස් ගණුදෙනු සංඛ්‍යාවක් සහ ඉහළම වටිනාකම් ප්‍රමාණයක් වාර්තා කළේය. එසේ වුවත් අලෙවි කරන ලද කොටස් සංඛ්‍යාව අතින් ප්‍රමුඛත්වය ගනු ලැබුවේ බීම වර්ග, ආහාර සහ දුම්කොළ යන අනු කාණ්ඩයන්ය. වර්ෂය තුළදී ඉහළ මට්ටමේ කොටස් හුවමාරු සංඛ්‍යාවක් වාර්තා කළ අනෙක් අනු කාණ්ඩයන් වූයේ නිෂ්පාදන සහ පාවහන් යන අංශයන්ය.

### 1.70 සංඛ්‍යා සටහන

### 1991 වර්ෂය තුළදී සමාගම් විසින් සිදු කරන ලද නව කොටස් නිකුතුන්

| සමාගමේ නම | ඉදිරිපත්කළ කොටස් ගණන | සම අගය | ඉදිරිපත් කළ කොටස් වල අගය | දායක වූ කොටස් වල වටිනාකම |
|---|---|---|---|---|
| සීමාසහිත කාර්සන් මාර්කටින් | 1,200,000 | 10/= | 12,000,000 | 34,035 |
| සීමාසහිත පුගොඩ ටෙක්ටයිල්ස් | 3,000,000 | 10/= | 30,000,000 | 30,973 |
| සීමාසහිත මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා | 3,100,000 | 10/= | 31,000,000 | 9,044 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ටුවරිස්ට්ස් ඇන්ඩ් හොටේලියර්ස් | 3,047,310 | 10/= | 30,473,100 | 816 |
| සීමාසහිත සිලෝන් ඔක්සිජන් | 1,800,000 | 10/= | 18,000,000 | 15,049 |

මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව

### 1.71 සංඛ්‍යා සටහන

### 1991 වර්ෂය තුළදී ද්විතීයක කොටස් වෙළෙඳ පොළෙහි ගණුදෙනු වූ කොටස් වර්ගීකරණ අනුව

| ආයෝජන වර්ගීකරණය | කොටස් ගනුදෙනු ප්‍රමාණය | කොටස් ප්‍රමාණය | වටිනාකම රුපියල් |
|---|---|---|---|
| බැංකු, මූල්‍ය හා රක්ෂණ | 26,057 | 21,971,015 | 1,007,168,676.25 |
| බීම වර්ග, ආහාර හා දුම්කොල | 8,019 | 24,098,156 | 947,667,385.65 |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | 3,571 | 1,987,291 | 143,989,428.25 |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | 2,340 | 2,020,515 | 52,801,362.00 |
| පාවහන් හා රෙදිපිළි | 11,308 | 4,374,347 | 222,379,711.00 |
| හෝටල් හා සංචාරක | 7,650 | 9,828,580 | 280,114,459.50 |
| භාරකාර ආයෝජන | 2,859 | 2,471,325 | 516,106,672.50 |
| ඉඩම් හා දේපල | 4,674 | 6,836,257 | 256,798,134.25 |
| නිෂ්පාදන | 16,573 | 14,556,224 | 555,623,713.00 |
| මෝටර් රථ | 3,302 | 4,161,176 | 205,187,528.00 |
| ඔයිල් පාම් | 60 | 65,425 | 35,834,110.00 |
| සේවා | 1,307 | 1,285,883 | 413,993,034.50 |
| ගබඩා හා සැපයුම් | 422 | 364,786 | 45,234,285.50 |
| වෙළෙඳ | 3,427 | 1,115,286 | 259,424,877.00 |

මූලාශ්‍රය:- කොළඹ කොටස් හුවමාරුව

## 1.72 සංඛ්‍යා සටහන

### කොටස් වෙළෙඳ පොළ දර්ශකයන් 1986 - 1991

| | 1986 | 1987 | 1988 | 1989 | 1990 | 1991 |
|---|---|---|---|---|---|---|
| 1. වෙළඳපොල ප්‍රාග්ධනීකකරණය (රු. දශ ලක්ෂ) | 11,812 | 18,460 | 15,694 | 17,087 | 36,880 | 82,700 |
| 2. නව නිකුතුන් සංඛ්‍යාව | 5 | 5 | 10 | 2 | 1 | 5 |
| 3. නිකුත් කළ මුළු කොටස් සංඛ්‍යාව (දශ ලක්ෂ) | 779 | 819 | 919 | 1,048 | 1,099 | 1,209 |
| 4. නිකුත් කළ කොටස් වල වටිනාකම (රු. ද. ල.) | 7,790 | 8,196 | 9,190 | 10,404 | 10,908 | 11,640 |
| 5. අලෙවිකළ කොටස් සංඛ්‍යාව (දශ ලක්ෂ) | 6 | 17 | 13 | 12 | 42 | 95 |
| 6. අලෙවිකල කොටස්වල වටිකාම (රු. ද. ල.) | 142 | 334 | 379 | 255 | 1,563 | 4,944 |
| 7. මිළ දර්ශක - සියළු කොටස් මිළ දර්ශකය | 141.38 | 217.97 | 172.44 | 179.49 | 384.39 | 837.79 |
| සංවේදී කොටස් මිල දර්ශකය | 218.19 | 384.12 | 309.56 | 341.74 | 680.30 | 1,198.60 |

මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව.

## 1.73 සංඛ්‍යා සටහන

### 1986 - 1991 වර්ෂය තුළ ආයෝජන වර්ගය අනුව නිකුත් කරන ලද නව කොටස් ගණන

| ආයෝජන විය | 1986 | 1987 | 1988 | 1989 | 1990 | 1991 |
|---|---|---|---|---|---|---|
| බැංකු, මූල්‍ය හා රක්ෂණ | - | 2 | 4 | 1 | - | 1 |
| බීම වර්ග, ආහාර හා දුම්කොළ | 1 | - | - | - | - | |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | - | - | - | - | - | - |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | - | - | - | - | - | - |
| පාවහන් හා රෙදිපිළි | - | - | - | - | - | 1 |
| හෝටල් හා සංචාරක | - | - | - | - | - | 1 |
| ආයෝජන භාර | 2 | - | - | - | - | - |
| ඉඩම් හා දේපල | 1 | 1 | 5 | - | - | - |
| නිෂ්පාදන | 1 | 2 | 1 | - | 1 | 1 |
| මෝටර් රථ | - | - | - | 1 | - | - |
| ඔයිල් පාම් | - | - | - | - | - | - |
| සේවා | - | - | - | - | - | - |
| ගබඩා හා සැපයුම් | - | - | - | - | - | - |
| වෙළඳ | - | - | - | - | - | 1 |
| එකතුව | 5 | 5 | 10 | 2 | 1 | 5 |
| ඉදිරිපත් කළ කොටස් ගණන (දශ ලක්ෂ) | 10.75 | 20.59 | 20.15 | 14.0 | 7.0 | 12.1 |
| ඉදිරිපත් කළ කොටස්වල වටිනාකම (රුපියල් දශලක්ෂ) | 130.5 | 205.9 | 201.5 | 140.0 | 70.0 | 121.5 |

මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව